
WWW.OLEVELAPI.COM

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2022 (2023)

# 21 - සිංහල භාෂාව හා සාහිත්‍යය

ලකුණු දීමේ පටිපාටිය



මෙය උත්තරපත්‍ර පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා සකස් කෙරිණි.
ප්‍රධාන පරීක්ෂක රැස්වීමේ දී ඉදිරිපත්වන අදහස් අනුව මෙහි වෙනස්කම් කරනු ලැබේ.

අවසන් සංශෝධන ඇතුළත් කළ යුතු ව ඇත.

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

# ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

## අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2022 (2023)

### 21 - සිංහල භාෂාව හා සාහිත්‍යය

### ලකුණු දීමේ පටිපාටිය

| | | | |
|---|---|---|---|
| I පත්‍රය | - | 1 × 40 | = ලකුණු 40 |
| II පත්‍රය | - | | |
| 01. ප්‍රශ්නය | - | 2 × 10 | = ලකුණු 20 |
| 02. ප්‍රශ්නය | - | | = ලකුණු 25 |
| 03. ප්‍රශ්නය | - | | = ලකුණු 10 |
| 04. ප්‍රශ්නය | - | | = ලකුණු 10 |
| 05. ප්‍රශ්නය | - | | = ලකුණු 15 |
| | | එකතුව | = ලකුණු 80 |

= ලකුණු 80

| | | | |
|---|---|---|---|
| III පත්‍රය | | | |
| 01. ප්‍රශ්නය | - | 2 × 10 | = ලකුණු 20 |
| 02. ප්‍රශ්නය | - | 4 × 5 | = ලකුණු 20 |
| 03. ප්‍රශ්නය | - | | = ලකුණු 15 |
| 04. ප්‍රශ්නය | - | | = ලකුණු 15 |
| 05. ප්‍රශ්නය<br>06. ප්‍රශ්නය<br>07. ප්‍රශ්නය | - | එක් ප්‍රශ්නයකට පමණක් පිළිතුරු සැපයිය යුතු යි. | = ලකුණු 10 |
| | | එකතුව | = ලකුණු 80 |

= ලකුණු 80

**අවසාන ලකුණු ගණනය කිරීම**

WWW.OLEVELAPI.COM

| | | |
|---|---|---|
| I පත්‍රයට ලකුණු | = | 40 |
| II පත්‍රයට ලකුණු | = | 80 |
| III පත්‍රයට ලකුණු | = | 80 |
| එකතුව | = | 200 |
| අවසාන ලකුණු | = | 200 ÷ 2 |
| | = | 100 |

**ලකුණු ලැයිස්තුවට ලකුණු ඇතුළත් කළ යුතු ආකාරය.**

I පත්‍රය මුළු ලකුණු ඉලක්කම් 2 කින් ඇතුළත් කළ යුතුය.

II පත්‍රය මුළු ලකුණු ඉලක්කම් 3 කින් ඇතුළත් කළ යුතුය.



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

## අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2022 (2023)
## උත්තරපත්‍ර ලකුණු කිරීමේ පොදු ශිල්පීය ක්‍රම

උත්තරපත්‍ර ලකුණු කිරීමේ හා ලකුණු ලැයිස්තුවල ලකුණු සටහන් කිරීමේ සම්මත ක්‍රමය අනුගමනය කිරීම අනිවාර්යයෙන් ම කළ යුතුවේ. ඒ සඳහා පහත සඳහන් පරිදි කටයුතු කරන්න.

1. සෑම සහකාර පරීක්ෂකවරයකුම උත්තරපත්‍ර ලකුණු කිරීමට රතුපාට බෝල් පොයින්ට් පෑනක් පාවිච්චි කරන්න.
2. ප්‍රධාන පරීක්ෂක විසින් දම්පාට බෝල් පොයින්ට් පෑනක් පාවිච්චි කළ යුතුය.
3. සෑම උත්තරපත්‍රයක ම මුල් පිටුවේ සහකාර පරීක්ෂක සංකේත අංකය සටහන් කරන්න. ලකුණු සටහන් කිරීමේ දී **පැහැදිලි ඉලක්කමෙන්** ලියන්න.
4. ඉලක්කම් ලිවීමේ දී යම් වැරදීමක් සිදු වුවහොත් එය පැහැදිලිව තනි ඉරකින් කපා හැර නැවත ලියා අත්සන යොදන්න.
5. එක් එක් ප්‍රශ්නයේ අනු කොටස්වල පිළිතුරු සඳහා හිමි ලකුණු ඒ ඒ කොටස අවසානයේ △ ක් තුළ භාග සංඛ්‍යාවක් ලෙස ලියා දක්වන්න. අවසාන ලකුණු ප්‍රශ්න අංකයත් සමග □ ක් තුළ, භාග සංඛ්‍යාවක් ලෙස ඇතුළත් කරන්න. ලකුණු සටහන් කිරීම සඳහා පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා ඇති තීරුව භාවිත කරන්න.
6. ගණිත පරීක්ෂක විසින් ලකුණු නිවැරදි බව සටහන් කිරීමට නිල් හෝ කළු පෑනක් භාවිතා කළ යුතුය.

**උදාහරණ : ප්‍රශ්න අංක 03**

(i) ........................................ √ △ $\frac{4}{5}$

(ii) ........................................ √ △ $\frac{3}{5}$

(iii) ........................................ √ △ $\frac{3}{5}$

(03) (i) $\frac{4}{5}$ + (ii) $\frac{3}{5}$ + (iii) $\frac{3}{5}$ — එකතුව → □ $\frac{10}{15}$

**බහුවරණ උත්තරපත්‍ර :**

01. කවුළු පත්‍රය සැකසීම

I. ලකුණු දීමේ පටිපාටිය අනුව නිවැරදි වරණ කවුළු පත්‍රයේ සටහන් කරන්න.
II. එසේ ලකුණු කළ කවුළු බ්ලේඩ් තලයකින් කපා ඉවත් කරන්න.
III. කවුළු පත්‍රය උත්තරපත්‍රය මත නිවැරදිව තබා ගත හැකි වන පරිදි විභාග අංක කොටුව හා නිවැරදි පිළිතුරු ගණන දැක්වෙන කොටුව ද කපා ඉවත් කරන්න.
IV. හරි පිළිතුරු හා වැරදි පිළිතුරු ලකුණු කළ හැකි වන පරිදි එක් එක් වරණ පේළිය අවසානයේ හිස් තීරයක් ද කපා ඉවත් කරන්න.
V. විෂය අංකය හා විෂය පැහැදිලිව පෙනෙන ආකාරයට එම කොටු ද කපා ඉවත් කරන්න.
VI. **කපා ගත් කවුළු පත්‍රය ප්‍රධාන පරීක්ෂකවරයා ලවා අත්සන් යොදා අනුමත කර ගන්න.**

02. **අනතුරුව උත්තරපත්‍ර හොඳින් පරීක්ෂා කර බලන්න. කිසියම් ප්‍රශ්නයකට එක් පිළිතුරකට වඩා ලකුණු කර ඇත්නම් හෝ එකම පිළිතුරක්වත් ලකුණු කර නැත්නම් හෝ වරණ කැපී යන පරිදි ඉරක් අඳින්න. ඇතැම් විට අයදුම්කරුවන් විසින් මුලින් ලකුණු කර ඇති පිළිතුරක් මකා වෙනත් පිළිතුරක් ලකුණු කර තිබිය හැක. එසේ මකන ලද අවස්ථාවකදී පැහැදිලිව මකා නොමැති නම් මකන ලද වරණය මත ද ඉරක් අඳින්න.**

WWW.OLEVELAPI.COM



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

03. කවුළු පත්‍රය උත්තරපත්‍රය මත නිවැරදිව තබන්න. නිවැරදි පිළිතුර ✓ ලකුණකින් ද, වැරදි පිළිතුර x ලකුණකින් ද ලකුණු කරන්න. නිවැරදි පිළිතුරු සංඛ්‍යාව ඒ ඒ වරණ තීරයට පහළින් ලියා දක්වන්න. අනතුරුව එම සංඛ්‍යා එකතු කර මුළු නිවැරදි පිළිතුරු සංඛ්‍යාව අදාළ කොටුව තුළ ලියන්න.

**ව්‍යුහගත රචනා හා රචනා උත්තරපත්‍ර :**

1. අයදුම්කරුවන් විසින් උත්තරපත්‍රයේ හිස්ව තබා ඇති පිටු හරහා රේඛාවක් ඇඳ කපා හරින්න. **වැරදි හෝ නුසුදුසු පිළිතුරු යටින් ඉරි ඇඳ වැරදි දමන්න. ලකුණු දිය හැකි ස්ථානවල හරි ලකුණු යෙදීමෙන් එය පෙන්වන්න.**

2. ලකුණු සටහන් කිරීමේදී ඕවර්ලන්ඩ් කඩදාසියේ දකුණු පස තීරය යොදා ගත යුතු වේ.

3. සෑම ප්‍රශ්නයකට ම දෙන මුළු ලකුණු උත්තරපත්‍රයේ මුල් පිටුවේ ඇති අදාළ කොටුව තුළ ප්‍රශ්න අංකය ඉදිරියෙන් **අංක දෙකකින් ලියා දක්වන්න.** ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් අනුව ප්‍රශ්න තෝරා ගැනීම කළ යුතුවේ. සියලු ම උත්තර ලකුණු කර ලකුණු මුල් පිටුවේ සටහන් කරන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස්වලට පටහැනිව වැඩි ප්‍රශ්න ගණනකට පිළිතුරු ලියා ඇත්නම් අඩු ලකුණු සහිත පිළිතුරු කපා ඉවත් කරන්න.

4. පරීක්ෂාකාරීව මුළු ලකුණු ගණන එකතු කොට මුල් පිටුවේ නියමිත ස්ථානයේ ලියන්න. උත්තරපත්‍රයේ සෑම උත්තරයකටම දී ඇති ලකුණු ගණන උත්තරපත්‍රයේ පිටු පෙරළමින් නැවත එකතු කරන්න. එම ලකුණ ඔබ විසින් මුල් පිටුවේ එකතුව ලෙස සටහන් කර ඇති මුළු ලකුණට සමාන දැයි නැවත පරීක්ෂා කර බලන්න.

**ලකුණු ලැයිස්තු සකස් කිරීම :**

I. එක් පත්‍රයක් පමණක් ඇති විෂයන් හැර ඉතිරි සියලු ම විෂයන්හි අවසාන ලකුණු ඇගයීම් මණ්ඩලය තුළදී ගණනය කරනු නොලැබේ.

II. එක් එක් පත්‍රයට අදාළ අවසාන ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවලට ඇතුළත් කළ යුතුය.

III. I පත්‍රයට අදාළ ලකුණු, ලකුණු ලැයිස්තුවේ "Total Marks" තීරුවේ **ඇතුළත් කර අකුරෙන් ද ලියන්න.**

IV. II පත්‍රයේ ලකුණු ලැයිස්තුව සැකසීමේ දී විස්තර ලකුණු ඇතුළත් කිරීමෙන් අනතුරුව II පත්‍රයේ අවසාන ලකුණු, ලකුණු ලැයිස්තුවේ "Total Marks" තීරුවේ ඇතුළත් කරන්න.

V. 43 චිත්‍ර විෂයයේ I, II හා III පත්‍රවලට අදාළ ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවල ඇතුළත් කර **අකුරෙන් ද ලිවිය යුතු වේ.**

VI. 21 - සිංහල භාෂාව හා සාහිත්‍යය, 22 - දෙමළ භාෂාව හා සාහිත්‍යය යන විෂයන්හි I පත්‍රයේ ලකුණු ඇතුළත් කර අකුරෙන් ලිවිය යුතු ය. II හා III පත්‍රවල විස්තර ලකුණු ඇතුළත් කර ඒ ඒ පත්‍රයේ මුළු ලකුණු, ලකුණු ලැයිස්තුවට ඇතුළත් කළ යුතු ය.

WWW.OLEVELAPI.COM

සැ.යු :- (I) **සෑම විටම එක් එක් පත්‍රයට අදාළ මුළු ලකුණු පූර්ණ සංඛ්‍යාවක් ලෙස ලකුණු ලැයිස්තුවට ඇතුළත් කළ යුතු ය. කිසිදු අවස්ථාවක පත්‍රයේ අවසාන ලකුණු දශම සංඛ්‍යාවකින් හෝ භාග සංඛ්‍යාවකින් නොතැබිය යුතු ය.**

(II) **ලකුණු ලැයිස්තුවල සෑම පිටුවකම ලකුණු ඇතුළත් කළ සහකාර පරීක්ෂක, ලකුණු පරී ක්‍ෂා කළ සහකාර පරීක්ෂක, ඇගයීම් ලකුණු තහවුරු කිරීමේ පරීක්ෂක හා ප්‍රධාන පරීක්ෂක තම සංකේත අංකය යොදා අත්සන් කිරීමෙන් නිරවද්‍යතාව තහවුරු කිරීම අනිවාර්ය වේ.**

***



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව**
**ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව**

**අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2022 (2023)**

## අභිමතාර්ථ
## I පත්‍රය

## 21 - සිංහල භාෂාව හා සාහිත්‍යය

මෙම ප්‍රශ්න පත්‍රය බහුවරණ ප්‍රශ්න හතළිහකින් සමන්විත වේ. මෙහි දී අපේක්ෂකයන්ගේ අවබෝධය, ස්මරණය, නිරවුල් දැනුම, භාෂා පරිචය හා භාවිතය පිළිබඳ ප්‍රමාණවත් දැනුමක් අපේක්ෂා කෙරේ.

## II පත්‍රය

මෙය ප්‍රශ්න පහකින් සමන්විත වෙයි.

**1 ප්‍රශ්නය.** කෙටි උත්තර අපේක්ෂිත ප්‍රශ්න 10කින් යුක්ත වෙයි. මෙහි දී සිංහල භාෂාවේ වචන කෝෂය, ව්‍යාකරණ ආදිය පිළිබඳ දැනුම අපේක්ෂා කෙරේ.

**2 ප්‍රශ්නය.** රචනා ලිවීමේ හැකියාව මැන බලන්නකි. දී ඇති විස්තරවලින් එකක් තෝරාගෙන ඒ යටතේ රචනාවක් ලිවීමත්, යෝග්‍ය මාතෘකාවක් යෙදීමත් අපේක්ෂා කෙරේ. මෙහි දී අපේක්ෂකයාගේ නිර්මාණ හා චින්තන ශක්තිය, ලේඛන කුසලතාව, නිරවුල් භාෂා භාවිතය, විශ්ලේෂණ හැකියාව මැන බැලීම ආදි අරමුණු කෙරෙහි අවධානය යොමු වෙයි.

**3 ප්‍රශ්නය.** සාරාංශකරණය යි. දී ඇති ඡේදය සංක්ෂේප කොට ලියා දැක්වීම මෙහි දී අපේක්ෂා කෙරේ. අපේක්ෂකයන්ගේ සංශ්ලේෂණ හැකියාව මෙන් ම භාෂා භාවිතය පිළිබඳ දැනුම ද මෙහි දී පරීක්ෂා කෙරේ.

**4 ප්‍රශ්නය.** අපේක්ෂකයන්ගේ භාෂා ඥානය හා අවබෝධය පරීක්ෂා කෙරෙන්නකි. මේ සඳහා දෙන ලද ඡේදයක් ආශ්‍රයෙන් ප්‍රශ්න ඉදිරිපත් කෙරේ. මේ ප්‍රශ්න මනාව අවබෝධ කරගෙන නිවැරදි පිළිතුරු ලිවීම අපේක්ෂිත යි.

**5 ප්‍රශ්නයේ** දී අපේක්ෂකයන් විවිධ ප්‍රායෝගික ලේඛන ලිවීමෙහි ලා දක්වන කුසලතාව විමසා බැලේ. මෙහි එක් ප්‍රශ්නයක් වනුයේ දැන්වීම් පත්‍රයක් සකස් කිරීම යි. එහි ම අනෙක් ප්‍රශ්නය වනුයේ රාජකාරි ලිපියක් ලිවීම යි. මෙබඳු ප්‍රශ්න මඟින් නූතන සමාජයෙහි භාවිත වන විවිධ ප්‍රායෝගික ලේඛන පිළිබඳ අධ්‍යයනය හා ඒවා සිත්ගන්නා පරිදි ලියා දැක්වීම පිළිබඳ අපේක්ෂකයන්ගේ කුසලතාව විමර්ශනය කෙරේ.

WWW.OLEVELAPI.COM

## III පත්‍රය

මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න හතකින් සමන්විත වෙයි. 1 ප්‍රශ්නයේ කොටස් දහයකි. මෙහි දී නිර්දිෂ්ට ග්‍රන්ථ පිළිබඳ අපේක්ෂකයන්ගේ අවබෝධය පරීක්ෂා කෙරේ.

**2 ප්‍රශ්නය** යොමු වන්නේ නිර්දිෂ්ට ග්‍රන්ථවල විමර්ශනාත්මක අවබෝධය පිළිබඳ අපේක්ෂකයින් සතු දැනුම පරීක්ෂා කිරීමට යි.

**3, 4 ප්‍රශ්න** නිර්දිෂ්ට ග්‍රන්ථ පිළිබඳ අපේක්ෂකයන්ගේ විශ්ලේෂණාත්මක, විචාරාත්මක හා තර්කානුකූල දැනුම පරීක්ෂා කිරීම සඳහා යොමු වෙයි.

**5, 6, 7 ප්‍රශ්නවලින්** අපේක්ෂකයන් පිළිතුරු සැපයිය යුත්තේ එකකට පමණි. මෙහි අභිමතාර්ථය වනුයේ නිර්දිෂ්ට ග්‍රන්ථ ආශ්‍රිත ව අපේක්ෂකයන් සතු ව පවත්නා විශ්ලේෂණාත්මක, විචාරාත්මක හා තර්කානුකූල දැනුම මැන බැලීම යි.

මෙම විෂයය වශයෙන් සැලකීමේ දී සිංහල I, II හා III ප්‍රශ්න පත්‍ර, අපේක්ෂකයන්ගේ භාෂා ඥානය හා සාහිත්‍යාවබෝධය පරීක්ෂා කිරීම සඳහා යොමු වන බව සඳහන් කළ යුතු ය.



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்

## අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2022 (2023)
## க.பொ.த. (சா.தர)ப் பரீட்சை - 2022 (2023)

| විෂය අංකය<br>பாட இலக்கம் | 21 | විෂයය<br>பாடம் | සිංහල භාෂාව හා සාහිත්‍යය |
|---|---|---|---|

### I පත්‍රය - පිළිතුරු
### I பத்திரம் - விடைகள்

| ප්‍රශ්න අංකය<br>வினா இல. | පිළිතුරෙහි අංකය<br>விடை இல. | ප්‍රශ්න අංකය<br>வினா இல. | පිළිතුරෙහි අංකය<br>விடை இல. | ප්‍රශ්න අංකය<br>வினா இல. | පිළිතුරෙහි අංකය<br>விடை இல. | ප්‍රශ්න අංකය<br>வினா இல. | පිළිතුරෙහි අංකය<br>விடை இல. |
|---|---|---|---|---|---|---|---|
| 01. | 1 | 11. | 4 | 21. | 4 | 31. | 3 |
| 02. | 2 | 12. | 2 | 22. | 1 | 32. | 2 |
| 03. | 2 | 13. | 4 | 23. | 4 | 33. | 3 |
| 04. | 3 | 14. | 1 | 24. | 1 | 34. | 4 |
| 05. | 4 | 15. | 4 | 25. | 3 | 35. | 2 |
| 06. | 4 | 16. | 3 | 26. | 2 | 36. | 1 |
| 07. | 3 | 17. | 2 | 27. | 1 | 37. | 4 |
| 08. | 1 | 18. | 1 | 28. | 4 | 38. | 2 |
| 09. | 3 | 19. | 3 | 29. | 1 | 39. | 3 |
| 10. | 2 | 20. | 3 | 30. | 3 | 40. | 4 |

WWW.OLEVELAPI.COM

විශේෂ උපදෙස් } එක් පිළිතුරකට ලකුණු **01** බැගින්
விசேட அறிவுறுத்தல் } ஒரு சரியான விடைக்கு **01** புள்ளி வீதம்

මුළු ලකුණු / மொத்தப் புள்ளிகள் **01 × 40 = 40**

---

පහත නිදසුනෙහි දක්වෙන පරිදි බහුවරණ උත්තරපත්‍රයේ අවසාන තීරුවේ ලකුණු ඇතුළත් කරන්න.
**கீழ் குறிப்பிடப்பட்டிருக்கும் உதாரணத்திற்கு அமைய பல்தேர்வு வினாக்களுக்குரிய புள்ளிகளை பல்தேர்வு வினாப்பத்திரத்தின் இறுதியில் பதிக.**

| | | | |
|---|---|---|---|
| **නිවැරදි පිළිතුරු සංඛ්‍යාව**<br>சரியான விடைகளின் தொகை | **25**<br>**40** | **I පත්‍රයේ මුළු ලකුණු**<br>பத்திரம் I இன் மொத்தப்புள்ளி | **25**<br>**40** |



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

# 21 - සිංහල භාෂාව හා සාහිත්‍යය
# II පත්‍රය

**ප්‍රශ්න අංකය 01**

**අපේක්ෂණය** - **භාෂා පරිචය ඇගයීම**

මෙම ප්‍රශ්නයට කෙටි උත්තර අපේක්ෂිත අනුප්‍රශ්න දහයක් ඇතුළත් වේ. අනුප්‍රශ්නයකට ලකුණු 02 බැගින් ලකුණු 20කි.

**ඉගෙනුම් පල** -

අක්ෂර වින්‍යාසය පිළිබඳ රීති අනුගමනය කරමින් ලියයි.

භාෂා භාවිතයේ දී වචන අර්ථවත් ව යොදයි.

ක්‍රියා පද නිවැරදි ව භාවිත කරමින් ලේඛන කාර්යයේ යෙදෙයි.

පද නිවැරදි ව සන්ධි කරයි.

ප්‍රත්‍යයාර්ථ නාම පද හඳුනා ගෙන ලේඛනයේ යෙදෙයි.

උක්තය, කර්මය හා ආඛ්‍යාතය පිළිබඳ අවබෝධය ප්‍රදර්ශනය කරයි.

විභක්ති අනුව නාම පද නිවැරදි ව යොදමින් ලේඛන කාර්යයේ යෙදෙයි.

වාක්‍යයක අවසාන ක්‍රියාව පැහැදිලි කරයි.

කර්තෘ කාරක හා කර්ම කාරක වාක්‍ය රීති අනුගමනය කරමින් නිවැරදි ව ලේඛනයේ යෙදෙයි.

වාක්‍ය රීති පිළිබඳ දැනුම ප්‍රදර්ශනය කරයි.

WWW.OLEVELAPI.COM



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

1. (i) සිට (x) තෙක් ඇති **සියලු ම** අනුකොටස්වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනුකොටසකට ඔබ උත්තර **නොලියන්නේ නම්, එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.**

(i) පහත සඳහන් වාක්‍යයේ ඇතුළත් මූර්ධජ අක්ෂර සහිත වචන **දෙකක්** ලියන්න.

"විදුහලේ දියුණුව වෙනුවෙන් සියලු ළමයි තම ශ්‍රමය හා කාලය කැප කරති."

(ii) පහත සඳහන් වාක්‍යයේ ඇතුළත්, අව්‍යය සමාසයට අයත් වචන **දෙකක්** ලියන්න.

"අනවශ්‍ය කලබලයකින් තොර ව, ලැයිස්තුවේ නම් සඳහන් අනුපිළිවෙළට, අලුත් පොත් ලබාගැනීම සඳහා පැමිණෙන ලෙස විදුහල්පතිතුමා ළමයින්ට දැන්විය."

(iii) පහත සඳහන් පද නිවැරදි ව විසන්ධි කර ලියන්න.

(අ) නැණැති (ආ) අත්‍යවශ්‍ය

(iv) පහත සඳහන් වාක්‍යයේ අක්ෂර වින්‍යාස දෝෂ සහිත වචන දෙකක් ඇත. එම වචන **දෙක** පමණක් නිදොස් කර ලියන්න.

"ප්‍රකාශන විලාශය යනු ලේඛකයා සිය වාංමාලාවෙන් තෝරා ගන්නා වචන ගළපා සිය ලේඛනය නිර්මාණය කිරීමේ දී අනුගමනය කරන තානය, තාලය හා වාගලංකරන ආදිය යි."

(v) පහත සඳහන් අදහස්වලට ගැළපෙන තනි පදය බැගින් ලියන්න.

(අ) වනාන්තරයෙහි හට ගන්නා ගින්න

(ආ) සැම කල්හි ම පවතින

(vi) පහත දැක්වෙන වාක්‍ය සදොස් ය. ඒවා නිදොස් කර ලියන්න.

(අ) ශිෂ්‍යයෝ සිංහරාජයට ඇතුළු වූහ'යි වනාරක්ෂක නිලධාරීහු අනුමාන කරති.

(ආ) ළමයින් හෝ දෙමාපියෝ හෝ ශ්‍රමදානයට සහභාගි වෙති.

(vii) පහත සඳහන් පදවලට විරුද්ධාර්ථවත් පදය බැගින් ලියන්න.

(අ) දුර්ලභ (ආ) ජංගම

(viii) පහත සඳහන් යෙදුම්වල තද කළු අකුරින් මුද්‍රිත පද අයත් වන ක්‍රියා පද ප්‍රවර්ගය නම් කරන්න.

(අ) විනෝද චාරිකාව අතරතුර දී ශිෂ්‍යයෝ **ගී ගයමින්** ප්‍රීති වූහ.

(ආ) "සැලළිහිණිය **වදු** කැලණිය පුරවරට"

(ix) පහත සඳහන් යෙදුම්වල පළමුවැනි වචනය සමග දෙවැනි වචනයේ නොගැළපීමක් ඇත. වඩාත් ගැළපෙන සේ පළමුවැනි වචනය හෝ දෙවැනි වචනය සකස් කර ලියන්න.

(අ) විදෙස් ප්‍රවෘත්ති

(ආ) කල්‍යාණ මිතුරා

(x) පහත සඳහන් වාක්‍ය කර්තෘ කාරකයට හරවා ලියන්න.

(අ) රියැදුරන් විසින් රථ පෙළපාළියක් සංවිධානය කරන ලදී.

(ආ) නිවේදකයා විසින් රසිකයන් වෙත ගායකයෝ හඳුන්වා දෙනු ලබති. (ලකුණු 02 × 10 = 20 යි)

WWW.OLEVELAPI.COM

(i) දියුණුව ළමයි කරති

(ii) අනවශ්‍ය අනුපිළිවෙළ

(iii) (අ) නැණ + ඇති

(ආ) අති + අවශ්‍ය

(iv) විලාසය වාගලංකරණ



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

(v) (අ) ලැව්ගින්න / ලාවාග්නි

(ආ) සදාතනික / සදාකාලික / සාර්වකාලික / සර්වකාලීන

(vi) (අ) ශිෂ්‍යයන් සිංහරාජයට ඇතුළු වූහ'යි වනාරක්ෂක නිලධාරීහු අනුමාන කරති.

(ආ) ළමයි හෝ දෙමාපියෝ (හෝ) ශ්‍රමදානයට සහභාගි වෙති.

(vii) (අ) සුලභ / සුලබ

(ආ) ස්ථාවර

(viii) (අ) මිශ්‍රක්‍රියා

(ආ) විධික්‍රියා

(ix) (අ) විදෙස් පුවත් / විදේශ ප්‍රවෘත්ති

(ආ) කල්‍යාණ මිත්‍රයා / කලණ මිතුරා

(x) (අ) රියැදුරෝ රථ පෙළපාලියක් සංවිධානය කළහ / කළෝ ය / කළාහු ය.

(ආ) නිවේදකයා රසිකයන් වෙත ගායකයන් හඳුන්වා දෙයි.

**ප්‍රශ්න අංකය 02**
**අපේක්ෂණය - විශ්ලේෂණ හැකියාව මැනීම**

මේ ප්‍රශ්නය සැකසීමේ දී අනුගමනය කර ඇත්තේ මාර්ගෝපදේශිත රචනා මූලධර්මය යි. එනම් ඉදිරිපත් කොට ඇති මග පෙන්වීම ප්‍රයෝජනයට ගනිමින් කිසියම් රචනාවක් ලිවීමට අපේක්ෂකයාට ඉඩ සැලැස්වීම යි. රචනයේ ඇතුළත් විය යුතු කරුණු, විස්තරය ඇසුරෙන් වටහා ගත යුතු ය. රචනයෙහි අන්තර්ගත විය යුතු ඡේද සංඛ්‍යාව ගැන වැටහීමක් දී ඇති විස්තරයෙන් ලබා ගත හැකි ය. මාතෘකාව ඉදිරිපත් කොට නැතත්, ඉදිරිපත් කොට ඇති විස්තර ඇසුරෙන් අපේක්ෂකයා මාතෘකාව සකස් කර ගත යුතු ය.

**ඉගෙනුම් පල -**

- **රචනා මාතෘකාවට අදාළ ව කරුණු රැස් කරයි.**
- **රැස් කරගත් කරුණු තර්කානුකූල ව පෙළගස්වයි.**
- **ශිල්පීය දක්ෂතා අනුගමනය කරමින් රචනා ලියයි.**
- **නිර්මාණාත්මක ලේඛනයේ යෙදෙයි.**

WWW.OLEVELAPI.COM



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

**2.** පහත දැක්වෙන (අ), (ආ), (ඉ), (ඊ) යන විස්තර අතුරෙන් එකක් තෝරාගෙන වචන 250කට නො අඩු වන සේ රචනයක් ලියන්න. යෝග්‍ය මාතෘකාවක් ද යොදන්න.

**(අ)** ලෝකයේ බොහෝ රටවල පවතින්නේ පානය කිරීම සඳහා භාවිත කළ නොහැකි දූෂිත ජල මූලාශ්‍රයන් ය. මෑතක් වනතුරු ම ශ්‍රී ලංකාවේ ජල මූලාශ්‍රය මානව පරිභෝජනයට යොදාගත හැකි මට්ටමේ පැවතුණ ද මේ වන විට ඒවායෙන් බහුතරයක් පරිභෝජනයට නුසුදුසු මට්ටමේ පවතින බව පර්යේෂකයෝ පවසති. කර්මාන්තශාලාවලින් අවිධිමත් පරිදි අපද්‍රව්‍ය මුදාහැරීම ජල දූෂණයට බලපාන ප්‍රමුඛතම සාධකයක් වන බැවින් එය වැළැක්වීමට පවත්නා නීති-රීති දැඩි කිරීමත් නව නීති හඳුන්වා දීමත් මෙහි දී සිදු කළ යුතු ය.

**(ආ)** දිනෙන් දින ඉහළ යන විදුලිබිල පාරිභෝගිකයන්ට මෙන් ම රාජ්‍ය ආයතනවලට ද දරාගත නොහැකි මට්ටමක පවතී. වසරෙන් වැඩි කාලයක් දැඩි හිරු රශ්මියක් පවතින ශ්‍රී ලංකාව වැනි රටක සූර්ය බලශක්තිය උත්පාදනය කිරීම අපහසුතාවකින් තොර ව සිදු කළ හැකි ය. මේ සඳහා අවශ්‍ය වන තාක්ෂණික දැනුම සහිත විශේෂඥයන් පුහුණු කිරීමට සහ යටිතල පහසුකම් සංවර්ධනය කිරීමට පියවර ගැනීමෙන් මේ අර්බුදයට පිළියම් සෙවිය හැකි ය.

**(ඉ)** කාටූන් යනු මෙරට ළමා පරපුර අතර බෙහෙවින් ජනප්‍රිය රූපවාහිනී වැඩසටහන් විශේෂයකි. බහුතරයක් කාටූන් නිර්මාණවල අන්තර්ගත වන්නේ විදේශීය පසුබිමක් සහිත අද්භූත කථා ප්‍රවෘත්තීන් ය. ළමයින් අතර වඩාත් ජනප්‍රිය මේ නිර්මාණ විශේෂය සඳහා ශ්‍රී ලාංකේය සමාජ සංස්කෘතික පසුබිම පිළිබඳ ව කියැවෙන ජනකතා යොදා ගැනීමට අවධානය යොමු කළහොත් දේශීය සම්ප්‍රදායයේ පැතිකඩ ගණනාවක් ළමා මනසෙහි රෝපණය කළ හැකි ය.

**(ඊ)** ඖෂධ හිඟය, පුහුණු වෛද්‍යවරුන්ගේ හිඟය මෙන් ම වෛද්‍ය උපකරණවල හිඟය ද හේතුවෙන් මෙරට රෝගීන්ට විධිමත් වෛද්‍ය ප්‍රතිකාර ලබා ගැනීමේ අවකාශය අහිමි වෙමින් පවතී. මේ ගැටලුවලට ස්ථිරසාර පිළියම් සොයන අතරේ ම මෙරටට ආවේණික වූ පාරම්පරික ව පවත්වා ගෙන එනු ලබන දේශීය වෛද්‍ය සම්ප්‍රදායය විධිමත් ව වැඩිදියුණු කිරීම කෙරෙහි ද අවධානය යොමු කිරීම කාලෝචිත ය.

(ලකුණු 25 යි)

(අ)

- මානව පරිභෝජනයට සුදුසු ජල මූලාශ්‍රය රැක ගැනීම
- මානව පරිභෝජනය සඳහා ජල මූලාශ්‍රය සුරැකීමේ අවශ්‍යතාව
- ජල මූලාශ්‍රය රැක ගැනීමේ අවශ්‍යතාව

(ආ)

- සූර්ය බලශක්තිය උත්පාදනයේ ඇති වාසි
- සූර්ය බලශක්තියෙන් විදුලි අර්බුදය ජයගැනීම
- විදුලි බිල පාලනයට සූර්ය බලශක්තිය යොදා ගැනීම

(ඉ)

- දේශීය සංස්කෘතිය මුසු කාටූන් කලාවක වටිනාකම
- කාටූන් කලාව සඳහා දේශීය ජනකතා යොදා ගැනීමේ යෝග්‍යතාව

(ඊ)

- දේශීය වෛද්‍ය සම්ප්‍රදාය විධිමත් ව වැඩි දියුණු කිරීමේ අවශ්‍යතාව
- දේශීය වෛද්‍ය සම්ප්‍රදාය නංවාලීමේ අවශ්‍යතාව

**ලකුණු විග්‍රහය -** මුළු ලකුණු 25 යි.

| | | |
|---|---|---|
| 01. සාරවත්භාවය, මාතෘකාව ද ඇතුළු ව | - | ලකුණු 08 යි. |
| 02. සංවිධානය, නිර්මාණාත්මකභාවය හා සජීවත්වය | - | ලකුණු 12 යි. |
| 03. ශිල්පීය දක්ෂතා සහ ඡේද බෙදා ලිවීම | - | ලකුණු 05 යි. |

WWW.OLEVELAPI.COM



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

01. සාරවත්භාවය - ලකුණු 07 යි.
විස්තරයට අදාළ වන පරිදි මාතෘකාවක් යොදා තිබීම - ලකුණු 01 යි.

තේමාවට අදාළ බව, ඉදිරිපත් කොට ඇති ව්‍යූහයට සමීප බව, සරුබව හා සමබව, වචන ගණන 250 සමීප ව පැවතීම යන කරුණු සාරවත්භාවය යටතේ සැලකිල්ලට ගත යුතු වේ.

02. සංවිධානය, නිර්මාණාත්මකභාවය හා ස්වීයත්වය - ලකුණු 12 යි.
මෙහි දී උසස් ප්‍රකාශන ශක්තිය, සංවිධානය, ස්වීයත්වය, නිර්මාණාත්මක ප්‍රකාශනය, ව්‍යක්ත ලේඛන ව්‍යවහාරය ආදී අංග ගැන සලකා බැලිය යුතු ය.

03. ශිල්පීය දක්ෂතා සහ ඡේද බෙදා ලිවීම - ලකුණු 05 යි.
වියරණ, අත්අකුරු, විරාම ලක්ෂණ භාවිතය, ඡේද අදාළ පරිදි වෙන් කොට තිබීම, පද වෙන් කොට ලිවීම යන අංග ගැන සලකා බලා ලකුණු තීරණය කළ යුතු වේ.

❖ **සැලකිය යුතු යි.**

01. රචනයේ වචන ගණන දළ වශයෙන් 200ට වඩා අඩු වන කල්හි ඉහත දක්වූ 1, 2, 3 යන කොටස්වලට ආනුපාතික ව ලකුණක් තීරණය කළ යුතු වේ.

02. වැදගත් අදහස්, සිත් ගන්නා ප්‍රකාශන ඇති තැන්වල (✓) යොදන්න. වැරදි තැන්වල (x) ලකුණු යොදන්න.

03. උක්තාඛ්‍යාත සම්බන්ධ වැරදි තැන් යටින් ඉරක් අඳින්න. අක්ෂර වින්‍යාසය වැරදි වචන වටා රවුමක් අඳින්න.
1, 2, 3 යන කොටස් සඳහා දෙන ලද ලකුණු උත්තරය අග හරස් අතට ලියා එකතු කර, මුළු ලකුණු ගණන ලබා ගන්න.

නිදසුන් - $\frac{6}{8}$ $\frac{9}{12}$ $\frac{3}{5}$ $\frac{18}{25}$

සංලක්ෂ්‍යය - ★ වාක්‍ය රචනා ඇගයීමට පෙර අදාළ ව්‍යූහය කියවා දළ සැලැස්මක් සකස් කර ගන්න. ව්‍යූහයට කිසිසේත් අදාළ නොවන සේ ලියා ඇති රචනා ඇගයීමේ දී සාරවත්භාවය සඳහා පිරිනැමිය යුත්තේ ඉතා අඩු ලකුණකි.

රචනය දුර්වල වුවත් මුළු ලකුණු වශයෙන් බින්දුව නො දෙන්න. සමස්තයක් ලෙස සලකා ලකුණු 02 - 05 අතර සංඛ්‍යාවක් පිරිනමන්න. උපරිම ලකුණු 05 ඉක්මවිය යුතු නො වේ.

සාරවත්භාවය මාතෘකාව ද ඇතුළු ව - ලකුණු 08

| | |
|---|---|
| මාතෘකාව ද සහිත ව සාරවත් කරුණු ප්‍රමාණවත් ව ඉදිරිපත් කිරීම, මාතෘකාව රචනාවට ගැළපෙන බව, මනා භාෂා භාවිතය, තේමාවට අදාළ ව ලියා තිබීම, සරුබව හා සමබව නිවැරදි ව රැක තිබීම, වචන 250ට සමීප ව පැවතීම. | 8-7 |
| සාරවත් කරුණු කිහිපයක් පමණක් ඉදිරිපත් කිරීම, මාතෘකාව ද රචනාවට ගැළපෙන පරිදි යොදා තිබීම, භාෂා ශෛලිය තරමක් හොඳින් පැවතීම, තේමාවට අදාළ බව තරමක් දුරස්වීම, සම බවෙහි හා සරුබවෙහි තරමක් දුර්වලතා පැවතීම, වචන ගණන 200ට වඩා අඩුවීම. | 6-5 |
| සාරවත් කරුණු ප්‍රමාණවත් පරිදි නොතිබීම, භාෂා ශෛලියේ දුර්වලතා පැවතීම, තේමාවට අදාළ නොවීම, මාතෘකාවක් යොදා තිබීම, සරුබව හා සමබව නොපැවතීම, වචන ගණන 200ට අඩුවීම. | ලකුණු 4ට අඩු |

WWW.OLEVELAPI.COM



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

සංවිධානය, නිර්මාණාත්මකභාවය හා ස්වීයත්වය ලකුණු 12

| | |
|---|---|
| උසස් ප්‍රකාශන ශක්තිය, මැනවින් කරුණු සංවිධානය කර තිබීම, ස්වීයත්වය ප්‍රදර්ශනය කිරීම, නිර්මාණාත්මක ව ලියා තිබීම, නිරවුල් බව, ව්‍යක්ත ලේඛන ව්‍යවහාරය භාවිත කිරීම. | 12-10 |
| ප්‍රකාශන ශක්තියෙහි දුර්වලතා තරමක් පැවතීම, කරුණු සංවිධානයේ දී දුර්වලතා තරමක් පැවතීම. | 9-7 |
| ප්‍රකාශන ශක්තියෙහි දුර්වලතා තරමක් පැවතීම, කරුණු සංවිධානය කර ගැනීමේ දී දුර්වලතා දක්නට ලැබීම,<br>ස්වීයත්වයෙහි ගැටලු දක්නට ලැබීම,<br>නිර්මාණාත්මක ව කරුණු ඉදිරිපත් කිරීමේ ගැටලු පැවතීම,<br>භාෂා ව්‍යවහාරයෙහි දුර්වලතා පැවතීම. | 6-4 |
| ප්‍රකාශන ශක්තියෙහි බොහෝ දුර්වලතා පැවතීම<br>කරුණු සංවිධානය කර ගැනීමේ දී බොහෝ දුර්වලතා දක්නට ලැබීම,<br>ස්වීයත්වය ප්‍රදර්ශනය නොකිරීම,<br>නිර්මාණාත්මකභාවය දක්නට නොලැබීම,<br>නිරවුල් නොමැතිවීම,<br>භාෂා ව්‍යවහාරයේ බොහෝ දුර්වලතා පැවතීම. | 3-1 |

ශිල්පීය දක්ෂතා - ලකුණු 05

| | |
|---|---|
| ව්‍යාකරණ රීති නිවැරදි ව අනුගමනය කර තිබීම,<br>පැහැදිලි අත්අකුරු භාවිත කිරීම,<br>විරාම ලක්ෂණ නිවැරදි ව භාවිත කිරීම,<br>නිවැරදි ඡේද වෙන්කිරීම,<br>අක්ෂර වින්‍යාස රීති භාවිතය. | 5 |
| ව්‍යාකරණ දෝෂ, අපැහැදිලි අත්අකුරු, විරාම ලක්ෂණමය දෝෂ, අක්ෂර දෝෂ තරමක් පැවතීම. | 4-3 |
| ඉහත දෝෂ බහුල වීම. | 1 |

**ප්‍රශ්න අංකය 03**

**අපේක්ෂණය** - කිසියම් කොටසක් කියවා, විස්තර වර්ණනා බැහැර කරමින්, එහි හරය වටහා ගෙන, ඒ ඇසුරින් සමස්ත අර්ථය තම වචනයෙන් ඉදිරිපත් කිරීමේ හැකියාව මෙහි දී ඇගයේ. ඒ අනුව සංශ්ලේෂණ හැකියාව මෙහි ලා විමසීමට ලක් කෙරේ.

ඉගෙනුම් පල -

- ලිපි ලේඛනවලින් වැදගත් කරුණු වෙන් කොට දක්වයි.
- වැදගත් කරුණු අර්ථවත් ව ගළපා ඉදිරිපත් කරයි.
- මුල් ලේඛනයේ අදහස් ආරක්ෂා වන පරිදි සාරාංශ කර දක්වයි.

**3. පහත සඳහන් පාඨය වචන 60 - 70 අතර වන සේ සාරාංශ කොට ලියන්න. ඔබේ සාරාංශයේ වචන සංඛ්‍යාව උත්තරය අග සඳහන් කරන්න.**

**ජනමාධ්‍ය නියාමනය මගින් අපේක්ෂා කෙරෙන අරමුණු දෙකක් පවතී. ඒවායින් එකක් වන්නේ මාධ්‍ය භාවිතය ප්‍රමිති සහගත එකක් බවට පත් කිරීම ය. අනෙක වන්නේ මාධ්‍යයේ පවතින සමාජ වගකීම පිළිබඳ අදහස් තහවුරු කිරීම ය. මාධ්‍ය නියාමනයේ ද ස්වරූප දෙකක් හඳුනාගත හැකි ය. අදාළ නියාමන ක්‍රියාවලිය මගින් ජනමාධ්‍ය ක්‍රියාකාරිත්වයේ වර්තමාන ස්වරූපය හඳුනා ගැනීම සහ එහි අනාගත පැවැත්ම පිළිබඳ අවශ්‍ය ප්‍රතිපත්තිමය රාමුව සකස් කිරීම ය. සෘජු හා වක්‍ර යන ආකාර දෙකින් නියාමන ක්‍රියාවලිය සිදු වේ. එහි දී සෘජු නියාමන ක්‍රියාවලියට අදාළ ව රාජ්‍ය අණපනත්, නීතිරීති හා කෙටුම්පත් සම්බන්ධ ප්‍රායෝගික භාවිතය කෙරෙහි අවධානය යොමු කෙරේ. වක්‍ර නියාමනය යනු ස්වයං නියාමනය යි. ඒ යටතට මාධ්‍ය ආචාරධර්ම අයත් වේ. මාධ්‍ය නිදහස අපේක්ෂා කරන ජනමාධ්‍යවේදීන් විසින් වඩාත් ම අපේක්ෂා කරනු ලබන්නේ ස්වයං නියාමනය යි. ඉහත සඳහන් කෙරුණු ද්විත්ව නියාමන ක්‍රියාවලිය මගින් ජනමාධ්‍ය කිසියම් පාලනයකට අනුකූල වේ. එහි දී හිමිකාරිත්වයේ අරමුණු සංතෘප්ත කිරීම පමණක් ජනමාධ්‍යවේදීහු අපේක්ෂා නො කරති. නිදහස් මාධ්‍ය සංස්කෘතියේ ගොඩනැගීම මෙන් ම ලිබරල්වාදී වෙළෙඳපොළ ආර්ථික රටාව තුළුවේ වඩාත් පුළුල් මාධ්‍ය ක්‍රියාකාරිත්වයක් ද ඔවුහු අපේක්ෂා කරති. මාධ්‍ය නියාමනය සඳහා පූර්ණ වශයෙන් රාජ්‍ය මැදිහත්වීම පමණක් ප්‍රමාණවත් නො වේ. වඩාත් යෝග්‍ය වන්නේ ඒ සඳහා ස්වයං නියාමනය පිළිබඳ ජනමාධ්‍යවේදීන්ගේ ආකල්ප දියුණු කිරීම ද ඊට සමගාමී ව සිදු කළ යුතු වීම යි. වඩාත් ඵලදායී මාධ්‍ය නියාමනයක් සිදු වන්නේ එවිට ය.**

(ලකුණු 10 යි)



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

සාරාංශකරණය :

**අන්තර්ගතය**

- මාධ්‍ය භාවිතය ප්‍රමිතිගත කිරීමත් මාධ්‍යයේ වගකීම තහවුරු කිරීමත් ජනමාධ්‍ය නියාමනයෙන් අපේක්ෂිත ය.
- ජනමාධ්‍ය ක්‍රියාකාරිත්වයේ ස්වරූපය හඳුනාගැනීමත් අනාගත පැවැත්ම පිළිබඳ ප්‍රතිපත්ති රාමුව සකස් කිරීමත් මාධ්‍ය නියාමනයේ දී වැදගත් ය.
- රාජ්‍ය ක්‍රියාවලියේ ප්‍රායෝගික භාවිතය ඍජු නියාමනයයි ස්වයං නියාමනය යනු වක්‍ර නියාමනයයි.
- ද්විත්ව නියාමනයෙන් ජනමාධ්‍ය පාලනයකට යටත් වන අතර ජනමාධ්‍යවේදීන්ගේ අපේක්ෂාව ස්වයං නියාමනයයි.
- හිමිකාරිත්වයේ අරමුණු සන්තෘප්ත කිරීමෙන් නොනැවතී පුළුල් මාධ්‍ය ක්‍රියාකාරීත්වයක් ජනමාධ්‍යවේදීහු අපේක්ෂා කරති.
- ඵලදායී මාධ්‍ය නියාමනයකට රාජ්‍ය මැදිහත් වීමත් ස්වයං නියාමනයත් වැදගත් වේ.

**සාරාංශකරණය:**

**මුළු ලකුණු ප්‍රමාණය 10 යි.**

**ලකුණු විග්‍රහය:**

01. අන්තර්ගතය - ලකුණු 06 යි.
02. වචන ගණන - ලකුණු 02 යි.
03. ශිල්පීය දක්ෂතා - ලකුණු 02 යි.

* වචන ගණන 75 ඉක්මවන කල්හි මුල් වචන 70 පමණක් ඇගයීමට ලක් කරන්න.
* වචන ගණන 55ට අඩු කල්හි එහි ඇතුළත් අදහස් පමණක් සැලකිල්ලට ගෙන ලකුණු පිරිනමන්න.
* ඡේද බෙදා තිබුණොත් ශිල්පීය දක්ෂතා කොටසින් ලකුණක් අඩු කරන්න.
* එක යට එක අසම්බන්ධිත වාක්‍ය ලෙස ලියා ඇත්නම් අන්තර්ගතයට දිය හැකි උපරිම ලකුණු ගණන 02කි.
* වචන ගණන 75ට වැඩි කල්හි හෝ 55ට අඩු කල්හි ලකුණක් අඩු කරන්න.
* දුර්වල සාරාංශ සඳහා බින්දුව නො දී ලකුණු 03ක උපරිමයකට යටත් ව ලකුණු පිරිනමන්න.

සාරාංශයේ අන්තර්ගතය සඳහා ලකුණු පිරිනැමීම - ලකුණු 06

| | |
|---|---|
| ප්‍රධාන කරුණු 6ක් ඉදිරිපත් කර තිබීම, වාක්‍ය අතර සම්බන්ධතාව ප්‍රශස්ත මට්ටමින් පවත්වා ගැනීම, නිරවුල් ව කරුණු ඉදිරිපත් කිරීම, වචන ගණන 60-70 අතර පැවතීම. | ලකුණු 05 - 06 |
| ප්‍රධාන කරුණු 4-5ක් පමණ ඇතුළත් වීම,<br>වාක්‍ය අතර සම්බන්ධතාව තරමක් රැකගැනීම,<br>වචන ගණන 50-60 අතර පැවතීම, නිරවුල්බව රැකගැනීම. | ලකුණු 03 - 04 |
| ප්‍රධාන කරුණු 4ට වඩා අඩුවෙන් ඉදිරිපත් කර තිබීම,<br>වාක්‍ය අතර සම්බන්ධතාව ගිලිහී තිබීම,<br>වචන ගණන 50ට අඩු වීම, නිරවුල් බව ගිලිහී තිබීම. | ලකුණු 01 - 02 |



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

**ප්‍රශ්න අංකය 04**

**අපේක්ෂණය** - ඉදිරිපත් කොට ඇති ඡේදය ඇසුරින් අවබෝධය පිළිබඳ හැකියාව මැනීම

**ඉගෙනුම් පල** -

- අවබෝධයෙන් යුතු ව පොතපත කියවයි.
- කියවා අවබෝධ කරගත් කරුණු ඉදිරිපත් කරයි.

**4.** **පහත සඳහන් පාඨය කියවා අසා ඇති ප්‍රශ්නවලට උත්තර සපයන්න.**

සාමූහික ආයාසයෙහි සහ පොදු අරමුණු සඳහා වැඩ කිරීමෙහි පුහුණුවක් ලබා ගැනීම සඳහා නාට්‍යයෙහි ඇති වටිනාකම ක්‍රීඩාවෙහි ඇති වටිනාකමට නොදෙවැනි බව ප්‍රකාශ කිරීම යෝග්‍ය ය. ක්‍රීඩාවෙන් නොලැබෙන වාසි දෙකක් නාට්‍යයෙන් ලැබේ. එනම්, නාට්‍ය කටයුතුවල දී වඩා විශාල කෞශල්‍ය සංඛ්‍යාවක් පුහුණු කිරීමට අවස්ථාව ලැබීම සහ මේ සියලු ම කෞශල්‍ය සඳහා යම්කිසි ප්‍රමාණයක උත්පාදක ශක්තියක් ලැබීමට හැකි වීම ය. තමා අවසානයේ දී රඟපාන කොටස නළුවා විසින් මවනු ලබන බව අමතක නො කළ යුතු ය. අධ්‍යක්ෂට කළ හැක්කේ, එය කළ යුත්තේ කෙසේ ද යන්න පිළිබඳ ව නළුවාට ඉඟි කිරීම පමණකි. එහෙත් එය නළුවා සඳහා මැවීම නම් ඔහුට කළ නො හැකි ය. වේදිකා සැරසිලිකරු, ඇඳුම් සැලසුම්කරු, වෙස් ගැන්නුම්කරු සහ ආලෝක සැලසුම්කරු යන තැනැත්තනට හිමි වන්නේ ද එවැනි ම තත්ත්වයකි. නාට්‍ය මගින් යම්කිසි අදහසක් ප්‍රකාශ කිරීම ප්‍රථමයෙන් නිෂ්පාදකයාගේ සිතෙහි ජනිත වේ. එය පසුව ප්‍රකාශ වන්නේ එය නිෂ්පාදනය කිරීමෙහි ලා සම්බන්ධ වන විවිධ පුද්ගලයන් විසිනි.

තමාගේ රඟ දැක්වීමෙහි ඇති උසස් පහත් බව නාට්‍යයෙහි අනෙකුත් නළුවන්ගේ රඟ දැක්වීම මත මුළුමනින් ම රැඳී ඇත්තේ ය යන වටිනා පාඩම ද නළුවා ඉගෙන ගනියි. නළුවකුට තනිව ම කොටසක් රඟ පෑමට සිදු වන්නේ කලාතුරකිනි. සුළු කොටස් රඟපාන්නවුන්ගේ සහාය නොලැබෙන්නේ නම්, නළුවකුට නාට්‍යයක ප්‍රධාන කොටසක් රඟපාන විට පවා උසස් තත්ත්වයකට පත් විය නො හැකි ය. එබැවින්, නාට්‍ය නිෂ්පාදනයෙහි ප්‍රධාන හෝ අප්‍රධාන හෝ යනුවෙන් රඟ දැක්වීම් කොටස් නොමැති බවත්, නාට්‍යය වනාහි විවිධ අවස්ථාවන්හි දී වේදිකා භාණ්ඩ එහා මෙහා ගෙන යන සහායකයන් විසින් පවා අත්‍යවශ්‍ය කාර්යයන් ඉටු කරනු ලබන සාමූහික ප්‍රයත්නයක් බවත් යනුවෙන් යම් කිසිවකු කරන ප්‍රකාශයෙහි කිසියම් අර්ථයක් ඇත්තේ ය. එබැවින්, නාට්‍ය රඟ දැක්වීම සම්බන්ධයෙන් ලබාගන්නා අද්දැකීම, පොදු අරමුණක් සඳහා ක්‍රියා කිරීමේ ද පෞද්ගලික කීර්තිය ලබා ගැනීමෙන් තොර ව මුළු ආයාසය සාර්ථක කර ගැනීම සඳහා සහාය වීමේ ද තෘප්තියක් ලබා ගතහැකි මඟක් වශයෙන් ළමයින්ට බෙහෙවින් ප්‍රයෝජනවත් වන්නේ ය.

නාට්‍යයක් නිෂ්පාදනය කිරීම නිසා අන් කිසිදු සාමූහික ක්‍රියාවක් මගින් ඇති නොවන පමණට පුද්ගලයන් සමූහයක් අතර අන්‍යෝන්‍ය අවබෝධය ඇති වෙතැයි පැවසීම නිවැරදි ය. නාට්‍යයක් නිෂ්පාදනය කිරීමේ දී කලාකරුවෝ එනම්, පුද්ගලාර්ථවාදීහු ද බොහෝ විට අල්ප නොවූ මමත්වයක් ඇති පුද්ගලයෝ ද විශාල සංඛ්‍යාවක් එක් වෙති. නිෂ්පාදකයා ද සිය නළුනිළියන්ගේ දුර්වලකම් අවංක ව පෙන්වා දෙන විට ඒවා පිළිගැනීමට ඔවුන්ට සිදු වේ.

(i) මේ ඡේදයෙහි සඳහන් වන පරිදි නාට්‍යයෙන් ලබාගත හැකි වාසි දෙක මොනවා ද?

(ii) කිසියම් නාට්‍යයක අන්තර්ගත වන අදහස ප්‍රකාශයට පත් කරන්නෝ කවරහු ද?

(iii) නාට්‍යයකින් නළුවකු ඉගෙන ගන්නා පාඩම කුමක් ද?

(iv) නාට්‍යයක් රඟ දැක්වීම සම්බන්ධයෙන් ලබාගන්නා අද්දැකීම ළමයින්ට බෙහෙවින් ප්‍රයෝජනවත් වන්නේ කවර හෙයින් ද?

(v) නළුනිළියන්ගේ දුර්වලකම් අවංක ව පෙන්වා දෙනු ලබන්නේ කවරකු විසින් ද?

(ලකුණු 02 × 5 = 10 යි)

WWW.OLEVELAPI.COM



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

(i) • නාට්‍ය කටයුතුවල දී වඩා විශාල කෞශල්‍ය සංඛ්‍යාවක් පුහුණු කිරීමට අවස්ථාව ලැබීම

• නාට්‍ය කටයුතුවල දී පුහුණු කළ කෞශල්‍ය සඳහා යම්කිසි ප්‍රමාණයක උත්පාදන ශක්තියක් ලැබීමට හැකි වීම

(ii) නාට්‍ය නිෂ්පාදනය කිරීමට සම්බන්ධ වන විවිධ පුද්ගලයන්

(iii) තමාගේ රඟ දැක්වීමෙහි ඇති උසස් - පහත් බව නාට්‍යයෙහි අනෙකුත් නළුවන්ගේ රඟ දැක්වීම මත මුළුමනින් ම රඳී පවතී යන්න

(iv) පොදු අරමුණක් සඳහා ක්‍රියා කිරීමේ ද, පෞද්ගලික කීර්තිය ලබා ගැනීමෙන් තොරව මුළු ආයාසය සාර්ථක කර ගැනීම සඳහා සහාය වීමේ ද තෘප්තියක් ලබාගත හැකි මඟක් වීම නිසා

(v) නිෂ්පාදකයා

**ප්‍රශ්න අංකය 05**

**අපේක්ෂණය** - ප්‍රායෝගික ලේඛන හැකියාව පිළිබඳ අපේක්ෂකයා සතු කුසලතා මැනීම

ඉගෙනුම් පල -

- ප්‍රායෝගික ලේඛනයේ දී ශිල්පීය උපක්‍රම අනුගමනය කරයි.
- අවශ්‍යතා අනුව විවිධ ප්‍රායෝගික ලේඛන සකස් කරයි.

**5.** ඔබේ ප්‍රදේශයේ ඇති හෝ ඔබ දන්නා සංචාරක ස්ථානයක් වෙත දේශීය සංචාරකයන් ආකර්ෂණය කරගැනීම සඳහා යෝග්‍ය අත්පත්‍රිකාවක් සකස් කරන්න. එහි දී පහත සඳහන් කරුණු පිළිබඳ සැලකිලිමත් වන්න.

- සංචාරක ස්ථානයෙහි ස්වභාවය
- එම ස්ථානය ආකර්ෂණීය ස්ථානයක් වීමට හේතු
- ගමන් පහසුව සලසා ගන්නා ආකාරය
- සංචාරකයන් විසින් අනුගමනය කළ යුතු දේ

අත්පත්‍රිකාවට වචන 100ක් පමණ සෑහේ.

**නැතහොත්**

විජයපුර විද්‍යාලයේ විද්‍යා ප්‍රදර්ශනයේ ආරම්භක දිනයට පැමිණි පුවත්පත් වාර්තාකරුවකුගේ කෙටි සටහනක් පහත දැක්වේ.

| | |
|---|---|
| විද්‍යා ප්‍රදර්ශනය | – 2023.05.18 |
| ප්‍රධාන අමුත්තා | – පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂතුමා |
| ප්‍රධාන අමුත්තාගේ කථාව | – විද්‍යා ප්‍රදර්ශනයක වැදගත්කම |
| | – ප්‍රදර්ශන කුටිවල සුවිශේෂතාව |
| | – අවට පාසල්වල සිසුන්ට ලැබෙන ප්‍රතිලාභ |
| | – ප්‍රදර්ශන සංවිධානයට පළාතෙන් ලැබෙන අවස්ථා |
| විදුහල්පතිතුමාගේ කථාව | – ප්‍රදර්ශනය සංවිධානය කිරීමට ගුරුවරුන්ගෙන්, දෙමාපියන්ගෙන් සහ සිසුන්ගෙන් ලැබුණු සහයෝගය |
| | – ප්‍රදර්ශනයේ වැදගත්කම |

ඉහත තොරතුරු පදනම් කරගෙන පුවත්පතකට යැවීම සඳහා සුදුසු වාර්තාවක් සකස් කරන්න. විජයපුර මාණ්ඩලික වාර්තාකරු කවිඳු ගුණරත්න ඔබ යයි සිතන්න. (වචන 100ක් පමණ සෑහේ.)

(ලකුණු 15 යි)

WWW.OLEVELAPI.COM



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාළ ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

**අත් පත්‍රිකාව**

**ලකුණු විග්‍රහය - මුළු ලකුණු 15 යි.**

1. ආකෘතිය ලකුණු 04 යි.
2. අන්තර්ගතය ලකුණු 08 යි.
3. ශිල්පීය දක්ෂතා ලකුණු 03 යි.

**1. ආකෘතිය - ලකුණු 04 යි.**

1. ශීර්ෂ පාඨය / මාතෘකාව — ලකුණු 01 යි.
2. පළකරන්නාගේ නම — ලකුණු 01 යි.
3. පළකරන දිනය — ලකුණු 01 යි.
4. නිර්මාණාත්මකභාවය — ලකුණු 01 යි.

**2. අන්තර්ගතය - ලකුණු 08 යි.**

(i) සංචාරක ස්ථානය පිහිටීම හා සම්බන්ධ කරුණු දෙකක් — ලකුණු 02 යි.

(ii) සංචාරක ස්ථානයට ආකර්ෂණය වීමට බලපාන හේතු දෙකක් — ලකුණු 02 යි.

(iii) සංචාරක ස්ථානයට ගමන් පහසුව සලසා ගන්නා ආකාරය
(ගමන් පහසුව පැහැදිලි ව දක්වා තිබිය යුතු ය) — ලකුණු 02 යි.

(iv) සංචාරකයන් අනුගමනය කළ යුතු කරුණු දෙකක් — ලකුණු 02 යි.

ස්ථානය අනුව නිවුන් නිවැරදියි.

**3. ශිල්පීය දක්ෂතා ලකුණු 03 යි.**

නිවැරදි අක්ෂර වින්‍යාසය, උක්ත ආඛ්‍යාත පද සම්බන්ධය, පැහැදිලි අත්අකුරු, නිවැරදි පද බෙදීම, විරාම ලක්ෂණ, ඡේද වෙන් කිරීම ආදිය සමස්තයක් ලෙස සලකා ලකුණු පිරිනමන්න.

- ❖ නියමිත වචන ගණන අඩු වන කල්හි හෝ ප්‍රමාණවත් කරුණු හෝ අදාළ කරුණු අන්තර්ගත නොවන අඩුපාඩු සහිත උත්තර ඇති කල්හි ආනුපාතික ලකුණක් දෙන්න.
- ❖ නියමිත ආකෘතිය අනුගමනය කර නොමැති කල්හි අන්තර්ගතය සඳහා දිය හැකි උපරිමය ලකුණු ගණන 03කි.

WWW.OLEVELAPI.COM

**නැතහොත්**

**පුවත්පත් වාර්තාව**

**ලකුණු විග්‍රහය මුළු ලකුණු - 15 යි.**

1. ආකෘතිය - ලකුණු 04 යි.
2. අන්තර්ගතය - ලකුණු 08 යි.
3. ශිල්පීය දක්ෂතා - ලකුණු 03 යි.



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

1. **ආකෘතිය - ලකුණු 04 යි.**

1. මාතෘකාව - ලකුණු 01 යි.
2. වාර්තා කරන්නේ කවුරුන් ද යන වග - ලකුණු 01 යි.
3. යෝග්‍ය ලෙස සිද්ධි ගළපා තිබීම - ලකුණු 02 යි.

2. **අන්තර්ගතය - ලකුණු 08 යි.**

(i) ප්‍රදර්ශනය පැවැත් වූ දිනය 23.5.18 ලකුණු 01 යි.

(ii) ප්‍රධාන ආරාධිත අමුත්තා ලකුණු 01 යි.

(iii) ප්‍රධාන ආරාධිත අමුත්තාගේ කතාවේ අන්තර්ගත

- විද්‍යා ප්‍රදර්ශනයක වැදගත්කම ලකුණු 01 යි.
- ප්‍රදර්ශන කුටිවල සුවිශේෂතාව ලකුණු 01 යි.
- අවට පාසල්වල සිසුන්ට ලැබෙන ප්‍රතිලාභ ලකුණු 01 යි.
- ප්‍රදර්ශන සංවිධානට පළාතෙන් ලැබෙන අවස්ථා ලකුණු 01 යි.

(iv) විදුහල්පතිතුමාගේ කතාවේ අන්තර්ගත

- ප්‍රදර්ශනය සංවිධානයට ලැබුණු සහයෝගය ලකුණු 01 යි.
- (මෙම) ප්‍රදර්ශනය පැවැත්වීමේ වැදගත්කම ලකුණු 01 යි.

3. **ශිල්පීය දක්ෂතා - ලකුණු 03 යි.**

නිවැරදි අක්ෂර වින්‍යාසය, උක්ත ආඛ්‍යාත පද සම්බන්ධය, පැහැදිලි අත්අකුරු, නිවැරදි පද බෙදීම, විරාම ලක්ෂණ ආදිය සමස්තයක් ලෙස සලකා ලකුණු පිරිනමන්න.

* නියමිත වචන ගණන අඩුවන කල්හි හෝ ප්‍රමාණවත් කරුණු හෝ අදාළ කරුණු අන්තර්ගත නොවන අඩුපාඩු සහිත උත්තර ඇති කල්හි අනුපාතික ලකුණක් දෙන්න.

* නියමිත ආකෘතිය අනුගමනය කර නොමැති කල්හි අන්තර්ගතය සඳහා දිය හැකි උපරිම ලකුණු ගණන 03කි.

WWW.OLEVELAPI.COM



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

# 21 - සිංහල භාෂාව හා සාහිත්‍යය
## III පත්‍රය

- ❖ **උපදෙස් දී ඇති පරිදි ප්‍රශ්න පහකට පමණක් උත්තර සපයන්න.**
- ❖ **1, 2, 3, 4 ප්‍රශ්නවලටත් 5, 6, 7 ප්‍රශ්නවලින් එකකටත් උත්තර සපයන්න.**

**මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත ලකුණු ගණන 80කි.**

මේ පත්‍රයේ දී නිර්දිෂ්ට සාහිත්‍ය පාඨ පිළිබඳ ව අපේක්ෂකයාගේ අවබෝධය හා රසවින්දන හැකියාව ඇගයීමට භාජනය කෙරේ.

**ප්‍රශ්න අංකය 01**

**අපේක්ෂණය** - නිර්දිෂ්ට ග්‍රන්ථ පරිශීලනය පිළිබඳ පරිචය ඇගයීම

ඉගෙනුම් පල -

- නිර්දිෂ්ට කෘති ලියැවුණු කාලය හා කතුවරයා හඳුනා ගෙන ප්‍රකාශ කරයි.
- නිර්දිෂ්ට කෘතිය නිර්මාණය කළ කතුවරුන්ගේ වෙනත් කෘති නම් කරයි.
- නිර්දිෂ්ට කෘතිවල කතුවරුන්ගෙන් සාහිත්‍යයට සිදු වූ සේවාව අගය කරයි.

**ලකුණු විග්‍රහය** - **මුළු ලකුණු 20 යි.**

මෙම ප්‍රශ්නයට කෙටි උත්තර අපේක්ෂිත අනුප්‍රශ්න දහයක් ඇතුළත් වේ. එක් අනුප්‍රශ්නයක එක කොටසකට ලකුණු 01 බැගින් මුළු ලකුණු 20කි.

WWW.OLEVELAPI.COM



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

1. (i) සිට (x) තෙක් ඇති සියලු ම අනුකොටස්වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනුකොටසකට ඔබ උත්තර නොලියන්නේ නම්, එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.

(i) "ඇතුළු නුවර දී රහස් කියන්නට නොපිළිවන. මඟුල් උයනට යමහ."
   (අ) මේ ප්‍රකාශය කරන ලද්දේ කවරකු විසින් ද?
   (ආ) එය ශ්‍රවණය කළේ කවරකු ද?

(ii) පහත දැක්වෙන කවියේ ඉතිරි පද දෙක සම්පූර්ණ කරන්න.

කෙලෙහි ගුණ     සිත්දේ
මුසිල     අන්ද මන්දේ

   (අ) ................................
   (ආ) ................................

(iii) "කවදාවත් ඕකෙන් පිට වෙලා එත්ඩ ඉඩ හම්බ වෙන්නෙ නෑ මිනිහෙකුට"
   (අ) මෙහි 'ඕකෙන්' යනුවෙන් අදහස් කළේ කුමක් ද?
   (ආ) මේ ප්‍රකාශය හා සබැඳි අවස්ථාව කුමක් ද?

(iv) ඉටු කොට කළ යුතු     යුතුකම්
ලැබුණත් ලෝකෙන්     ගැරහුම්
ඉවසන්නට පුළුවන්     නම්
උඹයි මගේ පුතා     උතුම්
   (අ) කවියට අනුව උතුම් පුතකු සතු ලක්ෂණය ලියන්න.
   (ආ) මේ කවිය ඇතුළත් පැදි පෙළේ රචකයා නම් කරන්න.

(v) "තෙල අහස සිට නැවූ විද්දත් දූවගේ පියාට දී ලා තමාගේ දුව ම පුතුන්ට පාවා දෙන්ට කියව."
   (අ) මෙහි විද්දත් පියාට දෙන්නට යැයි කීවේ මොනවා ද?
   (ආ) මේ ප්‍රකාශය ශ්‍රවණය කළේ කවරකු ද?

(vi) "රජයට හෝ දිවියට හෝ අන්තරාය වෙයි යන සිතින් නිදි නො ලත්මි."
   (අ) මේ ප්‍රකාශය ශ්‍රවණය කළ පුද්ගලයාගේ නම කුමක් ද?
   (ආ) මෙහි සඳහන් අයට නිදි නොලැබීමට බලපෑ හේතුව කුමක් ද?

(vii) "ඇහැටවත් නොපෙනෙන සතුන්ට පුළුවන් ද මෙච්චර ලොකු මිනිස් ඇඟකට හානි කරන්න?"
   (අ) මේ ප්‍රකාශය උපුටා ගත් නිර්මාණයේ නම ලියන්න.
   (ආ) මේ ප්‍රකාශය කිරීමට හේතු වූ කරුණ කුමක් ද?

(viii) ඔය දැල දොඩමලු ය, සුවඳ බැරුවා ඉන්ට
නිල් වතුර තුරුලු කර කෙසේ අතහැර යම් ද?
**කෙකටියා පඳුර සුදු මල් පොකුර වඩාගෙන**
සොඳුර, නුඹ වාගේ ම හිනැහේය මා එක්ක
   (අ) මේ පද්‍ය ඛණ්ඩය ඇතුළත් කාව්‍ය නිර්මාණයේ රචකයා නම් කරන්න.
   (ආ) තද කළු අකුරින් මුද්‍රිත පද්‍ය පාදයෙන් පැවසෙන අදහස ලියන්න.

(ix) රාජ කුමරියෝ පලඳිති
රන් මිණි බරණා
සිනිඳු වස්ත්‍ර හැඳලා රන්
මිරිවැඩි සඟළා
**පින් පිඩ වැනි මා මැණිය**
කියනු නොවළහා
   (අ) මේ ප්‍රකාශය කළ අයගේ නම ලියන්න.
   (ආ) තද කළු අකුරින් මුද්‍රිත පදයේ අන්තර්ගත කාව්‍යාලංකාරය කුමක් ද?

(x) (අ) පන්සිය පනස් ජාතක කථා පොත රචනා කිරීම සඳහා පාදක කර ගෙන ඇති ග්‍රන්ථය කුමක් ද?
   (ආ) 'පූජාවලිය' කෘතියෙහි කතුවරයාගේ නම ලියන්න.

(ලකුණු 02 × 10 = 20 යි)



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....
WWW.OLEVELAPI.COM

(i) (අ) කේවට්ට බමුණා/ කේවට්ටයා/ කේවට්ටාචාරී

(ආ) චූලනී බ්‍රහ්මදත්ත රජතුමා / බ්‍රහ්මදත්ත රජතුමා / උත්තර පඤ්චාල නුවර රජතුමා / උතුරු පසල් දනවු නුවර රජු

(ii) (අ) ජයෙහි ලොබ — බැන්දේ

(ආ) තමා වීණා තත ද — සින්දේ

(iii) (අ) සිරගෙදර / හිරගෙදර/ බන්ධනාගාරය / සිපිරිගෙය

(ආ) පුංචි මැණිකා සිරගෙදරට ගොස් පැමිණෙන විට මහල්ලා ඇයට ඇසෙන සේ ප්‍රකාශ කළ අවස්ථාව

(iv) (අ) යුතුකම් ඉටු කොට ඇති විට පවා ලෝකෙන් ගැරහුම් ලැබුණහොත් ඉවසීමට හැකි වීම.

(ආ) එස්. මහින්ද හිමි / ටිබෙට් ජාතික එස්. මහින්ද හිමි

(v) (අ) මසු දහස /මසුරන් දහස

(ආ) උග්ගසේන සිටු පුත්‍රයාගේ යහළුවා

(vi) (අ) හර්ග / හර්ග පුරෝහිතයා

(ආ) රාත්‍රියේ තමාගේ මඟුල් අවි දිලිසෙනු දැකීම / මඟුල් අවි දිලිසෙනු දැකීම
රජයට හෝ දිවියට හෝ අන්තරාය වෙයි යන බියෙන්.

(vii) (අ) අපට වැසිකිළියක්

(ආ) කථකයා පාසලේ දී උගත් කරුණු මවට ප්‍රකාශ කිරීම

(viii) (අ) රත්න ශ්‍රී විජේසිංහ

(ආ) කෙකටියා පඳුරුවල මල් පිපී ඇත.

(ix) (අ) සිංහසීවලී

(ආ) පින් පිඬ වැනි මා මැණිය - උපමාලංකාරය / උපමා

~~පින් පිඬ~~ - ~~රූපකාලංකාරය / රූපක~~

(x) (අ) පාලි ජාතකට්ඨ කථාව

(ආ) මයූරපාද පරිවේණාධිපති බුද්ධපුත්‍ර හිමි / බුද්ධපුත්‍ර හිමි

(ලකුණු 02 × 10 = 20 යි.)



WWW.OLEVELAPI.COM
අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

**ප්‍රශ්න අංකය 02**

**අපේක්ෂණය** - 1. නිර්දිෂ්ට සාහිත්‍ය පාඨ පිළිබඳ විමර්ශනාත්මක අවබෝධය

ඉගෙනුම් පල -

- උම්මග්ග ජාතකයේ නිර්දිෂ්ට කොටසේ අවස්ථා සම්බන්ධය නිවැරදිව දක්වයි.
- ගුත්තිල කාව්‍යයේ නිර්දිෂ්ට කවි අවබෝධයෙන් යුතු ව කියවා අර්ථය ඉදිරිපත් කරයි.
- ගුත්තිල කවියා යොදා ගත් කාව්‍ය උපක්‍රම අගය කරයි.
- 'අඟුල්මල් දමනය' කතාව අවබෝධයෙන් යුතු ව කියවා අර්ථය ඉදිරිපත් කරයි.
- නිර්දිෂ්ට සන්දේශ කවිවල අර්ථය ලිහිල් බසින් ඉදිරිපත් කරයි.

**ලකුණු විග්‍රහය** - **මුළු ලකුණු 20 යි. (එක් කොටසකට ලකුණු 04 බැගින්.)**

(අ) කොටස **ලකුණු 02 යි.**

(ආ) කොටස **ලකුණු 02 යි.**

2. පහත දැක්වෙන ගද්‍ය හා පද්‍ය පාඨ කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි උත්තර ලියන්න.

(i) "මහ **බෝසතාණන්** වහන්සේ ද, ඔද වැඩියා වූ සාගරය පරිද්දෙන් පොළොව මැඩ පියන්නා සේ වීර්‍ය පුරා ගෙන යන්නා වූ ඇත් අස් ආදී වූ **පිරිවරයෙන්** යුක්ත වැ **අසම්භීත වැ**, වාසල් දොර හරවා, නුවරින් නික්ම, රථයෙන් බැස, කෙසරු සලා විදහා කිලිපොළන්නා වූ සිංහ රාජයකු සේ **විජෘම්භනය** කෙරෙමින්, ධර්ම යුද්ධ මණ්ඩලයට ම වැඩි සේක"

(අ) තද කළු අකුරින් මුද්‍රිත පදවල අර්ථ ලියන්න.

(ආ) මහ බෝසතාණන් ධර්ම යුද්ධ මණ්ඩලයට පිවිසි අයුරු කෙටියෙන් විස්තර කරන්න.

(ii) රූ රැසේ අඳිනා ලෙසේ අත්
ලෙළ දිදී විදුලිය පබා
රන් රසේ එක් වන ලෙසේ වෙණ
නාදනු පා තබ තබා
කම්පසේ දෙන සැර ලෙසේ දෙස
බල බලා නෙතගින් සබා
මම් කෙසේ පවසම් එසේ වර
සුර ළඳුන් දුන් රඟ සුබා

(අ) මෙහි දැක්වෙන උපමා **දෙකක්** ලියන්න.

(ආ) සුරඟනන්ගේ රංගනයේ ස්වභාවය කවියා විස්තර කර ඇත්තේ කෙසේ දැයි කෙටියෙන් ලියන්න.

(iii) "එ කල්හි මහජනයා කොසොල් රජු ගෙ **ගෙවදොර** රැස් වැ 'මහරජ, තොප ගෙ රට අඟුල්මල් නම් සොරෙකු, දරුණු, ලෙමුඩු අත් ඇත්තෙ යැ, සතුන් කෙරෙහි **කුළුණු** නැත්තෙ යැ, ගම් නොගම් කෙළෙ, නියම්ගම් නොනියම්ගම් කෙළෙ, දනවු නොදනවු කෙළෙ, මිනිසුන් මරා ඇඟිලි විදැ මාලා කොටැ ධරයි. ඔහු වළකා' යි කියා මහ හඬින් හැඬූහු"

(අ) තද කළු අකුරින් මුද්‍රිත පදවල අර්ථ ලියන්න.

(ආ) මහජනයා අංගුලිමාල පිළිබඳ ව රජතුමාට කළ විස්තරය කෙටියෙන් දක්වන්න.

(iv) **සා ර පලය** අඹ දඹ රඹ ද වල් පිට
**මී** ර ජලය ඇළ දොළ කඳු පිටින් බට
**නෑ ර ලොලය** වඩවන දුටු දනන් හට
කෑ ර ගලය වැජැඹෙයි මේ ලෙසින් සිට

(අ) තද කළු අකුරින් මුද්‍රිත පදවල අර්ථ ලියන්න.

(ආ) කෑරගල ඇති සශ්‍රීකත්වය කවියා වර්ණනා කර ඇති ආකාරය කෙටියෙන් දක්වන්න.



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

(v) වල දිත අදහසින් මෙන් සුර ගග අඟන
**තල බල සකල දළ රළ පෙළ නුබ නැගෙන**
වෙල ළස ගැවැසි මුතු සක් පබළු බබළන
බල මහ මුහුද එම සඳැ උතුරින් පෙණෙන

(අ) තද කළු අකුරින් මුද්‍රිත පද්‍ය පාදයෙන් දැක්වෙන කාව්‍යාලංකාරය කුමක් ද?
(ආ) මහ මුහුදෙහි ස්වභාවය කවියා වර්ණනා කර ඇති ආකාරය කෙටියෙන් ලියන්න.
(ලකුණු 04 × 5 = 20 යි)

(i) (අ) අසම්භීතව - එඩිතර ව /නොබිය ව

විජෘම්භනය - වැජඹෙන / වැජඹීම

(ආ) මහබෝසතාණන් වහන්සේ උද්දාමයට පත් සාගරය මෙන්, පොළොව මැඩ ගෙන මෙන් වීර්‍ය පුරා යන ඇත් අස් ආදි වූ පරිවාරයෙන් යුක්ත ව එඩිතර ව වාසලේ දොරටු අරවාගෙන නුවරින් පිටත් ව රථයෙන් බැස කේසර සලන සිංහ රාජයකු සේ වැජඹෙමින් ධර්ම යුද්ධ මණ්ඩලයට වැඩි සේක.

(ii) (අ) රූ රැසේ අඳිනා ලෙසේ / රූප රාශියක් අඳිනා ලෙස
රන් රසේ එක් වන ලෙසේ / රන් හා රසදිය එක් වන ලෙස
කම්පසේ දෙන සැර ලෙසේ / අනංගයා දෙන (මල්) හී සර ලෙස

(ආ) සුරඟනන්ගේ අත් විදුලිය ප්‍රභාවෙන් යුක්ත ය. ඔවුන්ගේ තාලානුකූල හස්ත චලනය රූප රාශියක් අඳින්නාක් වැනි ය. වීණා නාදය අනුව පාද තැබීම රන්වලට රසදිය එක් වන්නාක් වැනි ය. නෙත් කොනින් සභාව දෙස හෙළන බැල්ම අනංගයා හී සර විදින්නාක් වැනි ය.

(iii) (අ)

- ගෙවද්දොර - රජගෙදර මිදුලට /මාලිගා මිදුලට/මාලිගාව අසලට/ රජ වාසල් දොර අසලට/ මළුවට
- කුළුණු - කරුණාව

(ආ) රජතුමනි, ඔබගේ රටෙහි අඟුල්මල් නම් සොරෙක් සිටියි. ඔහු දරුණු ය.
ලේ තැවරුණු අත් ඇත්තේ ය. සතුන් කෙරෙහි කරුණාවක් නො දක්වයි.
ගම් නොගම් කරයි. නියම්ගම් නොනියම්ගම් කරයි, දනවු නොදනවු කරයි.
මිනිසුන් මරා ඇඟිලි විදැ මාලයක් සාදා පැලඳ සිටියි.

(iv) (අ)

- සාර පලය - සාරවත් පලවලින් යුක්ත /සාරවත් පලතුරු
- නැර ලොලය - ආශාව අත් නොහැර / ආශාව ඇති කරවන

(ආ) සාරවත් පලවලින් යුක්ත වූ අඹ, ජම්බු කෙසෙල් ගස්වලින් පිරුණු වන බිම් ද කඳුවලින් ගලා බසිනා මිහිරි දිය පිරුණු ඇළ දොළ ද ආදියෙන් කැරගල බබළමින් පවතියි.



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

(v) (අ) ශබ්දාලංකාරය / අනුප්‍රාස / ශබ්ද ධ්වනිය

(ආ) අහස් ගඟ නමැති ස්ත්‍රිය වැලඳගන්නා අදහසින් මෙන් සුළඟේ වේගයෙන් චංචල වූ රළ පෙළ අහසට නැගෙයි. ඒ වේලෙහි වෙරළෙහි මුතු සක් සහ පබළු බබළයි.

**(ලකුණු 04 × 5 = 20 යි.)**

**3.**

- **අර්ථ රසයත්**
- **ශබ්ද රසයත්**

**මනාව සංකලනය කිරීම හංස සන්දේශයේ සාර්ථකත්වයට හේතු වී ඇත. නිර්දිෂ්ට කොටසින් එක් කරුණකට උදාහරණ දෙක බැගින් දක්වමින් විමසන්න.**

**නැතහොත්**

- **විද්දත් දියණියගේ චරිතයත්**
- **උග්ගසේන සිටුපුත්‌ගේ චරිතයත්**

**ඔබින් මතු කෙරෙන පරස්පර විරෝධී චරිත ලක්ෂණ කථා රසය තීව්‍ර කිරීමට හේතු වී ඇත. උග්ගසේන නම් සිටුපුතුගේ වස්තුව ඇසුරෙන් එක් කරුණකට උදාහරණ දෙක බැගින් දක්වමින් විමසන්න.**

(ලකුණු 15 යි)

3 ප්‍රශ්නය

**ඉගෙනුම් පල**

- නිර්දිෂ්ට සන්දේශ කවි රස විඳිමින් විචාරය කරයි.
- අවස්ථා, සිද්ධි හා චරිත නිරූපණය ගැන සැලකිලිමත් වෙමින් නිර්දිෂ්ට පෙළ රස විඳිමින් විචාරය කරයි.

03. අර්ථ රසය

උදා :

- පැසෙයි නිබඳ සුවඳැල් කෙත් වත් — අවට
- රසෙයි අමා රසමය ඒ පියස — දුට
- නිබඳ පැසී පල ලඹ දෙන — මිහිර'ඹය
- එමැද වෙහෙර දිළි දුර ලන සසර — බය
- මිහ'ඹ මුවමඬල මෙන් දිලෙන — හැම විට
- දුලබ ඉසුරු පිරි සැදි ඒ වෙහෙර — සිට
- දිමුත් වෙහෙර වට විසිතුරු මල් — වතුය
- මහත් තුරු මියුරු පල ගෙන නැමී — අතුය

ශබ්ද රසය

උදා :

- කුළින් කුළම සිහිල්'ඹ වැහෙන — කඳුරුය
- දොළින් දොළම කල් යල් කරන — කඹුරුය
- නුදුරු වැ සිහිලැ'ලී ය ගඟුලැ — ලී ය
- වට සැදි මල් වැලී ය සුදු — වැලී ය
- පවන'ද පිපි තුරේය නිර — තුරේ ය
- කුසුමන් පෙති තුරේ ය මළු — තුරේ ය

වැනි නිදසුන් දක්වමින් විස්තර කර තිබීම අවශ්‍ය ය. (වෙනත් සුදුසු උදාහරණ ද පිළිගන්න.)

WWW.OLEVELAPI.COM



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

**නැතහොත්**

**විද්දත් දියණියගේ චරිතය**

- ❖ සිටු පුත්‍රයා කෙරෙහි කිසිදු ආදරණීය හැඟීමක් ඇය තුළ නොමැති බව

උදා :

- "ගැල් රකිනවුන්ගේ පුත", "බර උසුලන්නවුන්ගේ පුත", "කුමකුත් නොදන්නවුන්ගේ පුතා"යි කියමින් ඔහුට අපහාසාත්මක ලෙස කතා කිරීමට ඇය පෙලඹෙන ආකාරය

උදා :

- "එසේය අනික් කාට කියම් ද? තොප ම කොට ඇවිදිනා කටයුතු හෙයින් තොප ම අරභයා කියමි"

- ❖ අපහාස කරන්නේ නම් තමා පලා යන බව සිටුපුත් ප්‍රකාශ කළ විට ඇය පවසන වදන්වලින් ඔහු කෙරෙහි ඇය තුළ ඇති අප්‍රසාදය පළවෙයි.

උදා :

- ඔයිත් "තොප ගිය මැන, හුන මැනව. තොප කුමකුත් නොදන්නා තැනැත්තවුන්ගෙන් මට කම් කිම් ද?

**උග්ගසේන සිටුපුත්ගේ චරිතය**

- ❖ සිටුපුත් විද්දත් දියණිය කෙරෙහි වූ ආලයෙන් මුසපත් ව කටයුතු කළ ආකාරය

උදා :

- "ලදොත් ජීවත් වෙමී. නොලදොත් මියෙමී සිතා ගෙන නොකා නොබී හැඳට නැඟී ලා වැද හොත්තාහ.

- ❖ ඔවුන් හා එක්වුවහොත් දුව පාවා දෙන බව විද්දත් පියා පැවසූ අවස්ථාවේ උග්ගසේන සිටුපුත් කටයුතු කළ ආකාරය

උදා :

- "එසේ වී නම් මම උන් හා එක් වෙමි"

WWW.OLEVELAPI.COM

- ❖ බිරිඳ තමාට අපහාස කරමින් පුතු නළවන අවස්ථාවේ ඔහු දැඩි පීඩනයක පසුවන ආකාරය පැහැදිලි වන අයුරු

උදා:

- "තොප නිසා විද්දත් වූවා මඳින් නපුරුත් ඇසුව මනා ද ? පලා යෙමි".

- ❖ තම බිරිඳ මහත් අභිමානයෙන් කටයුතු කරන්නේ ඇය දන්නා ශිල්පය නිසා බව වටහා ගත් ඔහු තමා ද ශිල්ප ඉගෙන ගන්නවා යැයි දැඩි අධිෂ්ඨානයකට පැමිණීම

උදා :

- "ඇගේ ඒ බැවුම් පලවා මමත් ශිල්ප උගනිමි".

වැනි කරුණු උදාහරණ වශයෙන් දක්වමින් පිළිතුරු සපයා තිබිය යුතු ය.



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

**ප්‍රශ්න අංකය 04**

ඉගෙනුම් පල

- බැද්දේගම නව කතාවේ නිර්දිෂ්ට කොටසේ ගැබ් වූ නවකතා ලක්ෂණ හඳුනාගෙන ඉදිරිපත් කරයි.
- බැද්දේගම නවකතාව රසවිඳිමින් විචාරය කරයි.
- ගංගාවේ සංගීතය කවිපන්තියේ නිර්මාණාත්මක ලක්ෂණ අගය කරයි.
- කවි පන්තිය රස විඳිමින් විචාරය කරයි.

**4.**
- **දරිද්‍රතාවට ගොදුරුවීමත්**
- **අන්ධ විශ්වාසයන්ට නතුවීමත්**

**බැද්දේගම විසූ ගැමියන් විනාශ මුඛයට යාමට හේතු වූ ප්‍රධාන කරුණු ලෙස දැක්විය හැකි ය. නිර්දිෂ්ට කොටසින් එක් කරුණකට උදාහරණ දෙක බැගින් දක්වමින් පැහැදිලි කරන්න.**

**නැතහොත්**

- **උපයුක්ත භාෂා ශෛලියත්**
- **උචිත කාව්‍ය උපක්‍රම භාවිතයත්**

**ගංගාවේ සංගීතය කාව්‍ය නිර්මාණය පාඨක සිත් ඇද ගැනීමට හේතු වී ඇත. එක් කරුණකට උදාහරණ දෙක බැගින් දක්වමින් පැහැදිලි කරන්න.**

(ලකුණු 15 යි)

**දරිද්‍රතාවට ගොදුරු වීම**

❖ බබුන් සිරගත වූ පසු මාස හයක් ගත කරන්නේ කෙසේ ද යන්න පුංචි මැණිකා සිතන ආකාරය

උදා :

- පුංචි මැණිකාට සහ කර්ලිනාහාමිට වේලක් ඇර වේලක් කා මාස හයක් ගත කර ගැනීමට සෑහෙන තරම් ධාන්‍යයක් වත් ගෙයි ඉතිරි වී නොතිබුණේය.

❖ කර්ලිනාහාමි වයසට වඩා වැහැරී ඇති අයුරු දක්වන ආකාරය

උදා :

- අව්ව හා සුළඟත් වෙහෙසත් බඩගින්නත් ලෙඩ දුකත් ශරීර ශක්තිය මෙන් ම මානසික ශක්තිය ද උරා බොයි.

❖ තමාගේත් කර්ලිනාහාමිගේත් ජීවත් වීම සඳහා පුංචි මැණිකාට බොහෝ වැඩ කළ යුතු වීම

උදා :

- බිස්සේ තිබූ කුරක්කන් ඉවර වූ පසු කෑ හැකි කොළ වර්ග අල වර්ග හා පලතුරු සෙවීමට වනයට යාමට සිදු වීම
- හේන් වාරයට අනුන්ගේ හේන්වල වැඩ කිරීම
- ඇයට දුන් කුරක්කන් අහුරු කිහිපයකට ඈ බොහෝ වෙහෙස වී වැඩ කළ යුතු වූවා ය.

WWW.OLEVELAPI.COM



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

**අන්ධ විශ්වාසයන්ට නතු වීම**

- ශරීරයට පෙර සිත නැති වී යාම සාමාන්‍යයෙන් කැලෑ බද ගම්වල ගැහැනුන් අතර බහුල ව දක්නට ලැබෙන ධර්මතාවකි.
- ආරච්චිගේ ගෙයි වාසය කරන්නට කිසිවෙකුත් ඉදිරිපත් නොවීම

උදා :

අපල ගෙන දෙන අසුබ නිමිති ඇත්තේ යයි ද අවතාර අඩිකෝඩවලින් පිරුණේ යයි ද ප්‍රසිද්ධ ව ගිය මේ ගෙයි වාසයට ඒමට තරම් සැහැසි වූ කිසිවෙක් ගමේ නොවූහ.

- නැන්චොහාමි කළ ප්‍රකාශය

මේ ගම දැන් හොල්මන් අඩිකෝඩ පිරුණු යකුන් අරක් ගත් කාලකණ්නි ගමකි.

වැනි උදාහරණ දක්වමින් පිළිතුරු ලියා තිබීම අවශ්‍ය ය

**නැතහොත්**

**04. උපයුක්ත භාෂා ශෛලිය**

- සරල බස් වහරක් යොදා ගැනීම

උදා : ඕනෑම කවියකින් උදාහරණ දක්වා තිබීම ප්‍රමාණවත් ය

- අනුප්‍රාසය මුසු බස් වහර

උදා:

සැඟවෙමි- එබෙමි-නිසසල වෙමි- සසල වෙමි

මී අඹ - කිරල- මාදම් ගෙඩි ළදරු වියේ

- භාෂාත්මක යෙදුම් භාවිතය

උදා:

කලදෝ දියෙන් පොඟවා රන් පුලින තලා

ඇකයෙහි හෙළා හඬවයි සැඬ සුළඟ රැයේ

- අද්දැකීම රසවත්ව ඉදිරිපත් කිරීමට භාෂාව යොදාගෙන ඇති ආකාරය

එන්නේ කොහි සිට ද - කොතැනකට ද යන්නේ

ඔබ කුමකට ද මා දුටු තැන විමසන්නේ

කාව්‍ය උපක්‍රම යොදා ගැනීම

- රූපකාලංකාර භාවිතය

උදා :

- මහ මූහුදූ හිමි
- හිරිමල් සීතා රැළි පෙණ පිඬු මිහිරිතම

WWW.OLEVELAPI.COM



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

❖ ශබ්දාලංකාර යොදා ගැනීම

උදා :

- සැඟවෙමි - එබෙමි - නිසසල වෙමි - සසල වෙමි
- ගල්පරවලම හැපි හැපි බිහි කරමි මම
- මී අඹ - කිරල - මාදම් ගෙඩි ළදරු වියේ

❖ එළිසමය යොදාගෙන ඇති ආකාරය

උදා :

මිනිසුන් ඉවුරුවල යන එන අඩි සද්දෙන්
ළය යට සසල බව මින් මතු නොනැඟෙද්දෙන්
කෙකටිය ඕලු නළියන දිය රැළි මැද්දෙන්
මල් පෙති වියළි කොළ එන අතකට එද්දෙන්

❖ උත්තම පුරුෂ දෘෂ්ටිකෝණයෙන් නිර්මාණය ඉදිරිපත් කිරීම

සැඟවෙමි - එබෙමි - නිසසල වෙමි - සසල වෙමි
ගල්පරවලම හැපි හැපි බිහි කරමි මම
හමු වුණු කෙණෙහි මා සතු බර ඔහුට දෙමි

❖ අජීව වස්තු සජීවත්වයට පත් කිරීම
නොමියන හේලි දහමක පණිවුඩය පිට
කොඳුරමි කෙඳිරියක් මුළු ලොව නිසල කොට

වැනි උදාහරණ දක්වමින් විස්තර කර තිබීම අවශ්‍ය ය.

❖ 3, 4 පිළිතුරු සඳහා උදාහරණ 4ට ලකුණු 04 යි.
සමස්ත විස්තරයට ලකුණු 11 යි.
මුළු ලකුණු 15 යි.

- **5, 6, 7 ප්‍රශ්නවලින් එකකට පමණක් උත්තර ලියන්න.**

**ප්‍රශ්න අංකය 05**

ඉගෙනුම් පල

- දියමන්ති මාලය කෙටි කතාව රස විඳිමින් විචාරය කරයි.
- අඟුල්මල් දමනය කථාව රස විඳිමින් විචාරය කරයි.
- ජන කවි රස විඳිමින් විචාරය කරයි.

5. 'දියමන්ති මාලය' කෙටි කතාවේ මැටිල්ඩාගේ චරිතයෙන් නිරූපණය කෙරෙනුයේ තම තරම නොදැන ජීවත් වීමට යාමෙන් ව්‍යසනයට පත්වන්නන්ගේ යථා ස්වභාවය යි. උදාහරණ **තුනක්වත්** දක්වමින් විමසන්න.

(ලකුණු 10 යි)

තම තරම නොදැන ජීවත් වීමට යාමෙන් ව්‍යසනයට පත්වන්නන්ගේ යථා ස්වභාවය දියමන්ති මාලය කෙටිකතාවේ මැටිල්ඩාගේ චරිතයෙන් නිරූපණය වී ඇති ආකාරය මෙහි දී විස්තරාත්මක ව දක්වා තිබිය යුතු ය.

WWW.OLEVELAPI.COM



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

- තමන් බලාපොරොත්තු වූ සමාජ තත්ත්වය තමන්ට ළඟා කර ගැනීමට නොහැකි වූ නිසා මැටිල්ඩා නිරන්තරයෙන් කනස්සල්ලෙන් පසු වූ ආකාරය

උදා :

"නිවසේ දිළිඳු අසරණකමින්, එහි බිත්තිවල කාලකණ්ණි දුක්බර පෙනුමෙන්, දිරා ගිය පුටුවලින් හා අවලස්සන දොර ජනෙල් රෙදිවලින් බලවත් සේ සිත් තැවුලට පත් ඇ මනස්තාපයෙනුත් පශ්චාත්තාපයෙනුත් කාලය ගත කළා ය. ඇයගේ සමාජ තත්ත්වයේ සිටි අනෙක් ස්ත්‍රියකට කිසිම අමුතු ශෝකයක් හෝ අමුතු දොම්නසක් ඇති නොවන මේ සියලුම දේවලින් ඇ කනස්සල්ලටත් කනගාටුවටත් පත්වූවා ය.

- ලද දෙයින් සැනසීමට පත් නොවී මනෝලෝකයක තනිවෙමින් ශෝක වීම

උදා :

විශාල අත්පුටුවල වැතිර නිදිබර ව සිටින, සරුවාල ඇඳ ගත් දැවැන්ත සේවකයන් දෙදෙනෙකුත් විසින් ආවතේව කරනු ලබන, නිහඬ නිශ්ශබ්ද අන්තර් ගර්භාගාර පිළිබඳ සිහින ඇ සිතින් මවා ගත්තා.

...සුගන්ධවත් සුන්දර ආගාර ද සිතින් මවා ගත් ඇ ඒවා පිළිබඳ කල්පනාවෙන් මනෝලෝකයක ජීවත් වූවා ය.

- තම තරම නොදැන දිවි ගෙවීමට උත්සාහ කිරීම නිසා විවාහ ජීවිතයේ අනේක ගැටුම් ඇතිවන ආකාරය

උත්සවයක් සඳහා ආරාධනා පත්‍රයක් ලැබූ අවස්ථාවේ සිට ඇය ක්‍රියා කරන ආකාරයෙන් ප්‍රකට වන්නේ ඔවුන්ගේ විවාහ ජීවිතය අනවශ්‍ය ලෙස සංකීර්ණත්වයට පත් කර ගත් ආකාරයයි.

"ඕකෙන් මට මොකක් කරන්නෙයි කියලා ද කියන්නේ? "

"ඇයි අනේ, මම හිතුවා ඔයා ඕකට සතුටු වෙයි කියලා; ඔයා කවදා වත් ගමනක් බිමනක් යන්නෙ නෑ නේ.."

"ඉතින් මොකක්ද මට තියෙන්නෙ ඇඟේ දා ගෙන යන්න ඔයි වගේ තැනකට? "

"නෑ මොකුත් නෑ මට අඳින්න ඇඳුමක් නෑ. ඒක හින්දා ඔය පාටියට යන්න බෑ. මට වඩා හොඳට ඇඳුම් පැලඳුම් තියෙන භාර්යාවක් ඉන්න යාළුවෙකුට ඕක දෙන්න.

- තමන්ගේ ආර්ථික තත්ත්වය අනුව ජීවිතය හැඩගස්වා නොගෙන "දියමන්ති මාලයක්" පැලඳීමට ගොස් මැටිල්ඩා අවාසනාවන්ත ජීවන ඉරණමකට මුහුණ පෑ ආකාරය

උදා :

- නෑ .. පොහොසත් ගෑනු මැද්දේ දුප්පත් විදියට ඉන්න එක තරම් ලැජ්ජා නැති වැඩක් නෑ...
- ... ඉක්බිති ව ඒවා ළිහා තැබීමට සිත සාදා ගත නොහැකි වූ ඇ, පැකිළෙමින් වරින් වර, "වෙන ආභරණ හේම මොකුත් නැද්ද අනේ?" මිතුරියගෙන් ප්‍රශ්න කළා ය.
- මේක මට ණයට දෙන්න පුළුවන් ද? මේක විතරයි මං ඉල්ලන්නේ"...
- ...අගනා ලොම් කබාවල දැවටෙමින් සිටි අනෙක් කාන්තාවන්ගේ ඇසට හසු නොවනු සඳහා එතැනින් හැකි ඉක්මනින් පලා යාමට ඇ උත්සාහ කළා ය..........



WWW.OLEVELAPI.COM

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

- කරම නොදැන ජීවත්වීමට යෑමෙන් මැටිල්ඩාට පමණක් නොව ඇගේ සැමියාට ද ව්‍යසනකාරී ජීවන තත්ත්වයක් උරුම කර ගැනීමට සිදු වීම

උදා :

"ෆොරෙස්ටියර් නෝනාගේ මාලෙ- මාලෙ නැතිවෙලා "..

එම සුමානයේ දී අවුරුදු පහකින් වයසට ගොස් සිටි ලොයිසල් මහතා,
"දැන් ඉතින් නැති වුණ මාලෙ වෙනුවට වෙනින් මාලයක් අපි අරන් දෙන්න බලන්න ඕනෙ"

"ඉක්බිතිව ඔවුහු පසුතැවිල්ලෙන් හා වේදනාවෙන් පීඩිත ව තම තමන්ගේ මතකයේ සැටියට අර නැති වූ මාලයට සමාන මාලයක් සොයමින් වෙළෙන්දකු වෙළෙන්දකු පාසා යෑමට පටන් ගත්තෝ ය...

එතැන් සිට අඟහිඟකම්වලින් මිරිකුණු ජීවිතයක බියකරුකම ලොයිසල් මහත්මියට දැනෙන්නට විය...

"අනේ, මගේ අසරණ මැටිල්ඩා ඔයා කොච්චර වෙනස් වෙලා ද ?

"ඔව්. එදා ඔයාව හම්බු වෙලා කථා බස් කරලා ගිය දවසෙ ඉඳන් අද වන තුරු මම වින්ද කරදර හිරිහැර අනන්තයි. අප්‍රමාණයි...

"ඔව්. ඔයාට ඒක තේරුණෙ නෑ නේද ? ආයි ඇරලා නෑ. දෙක ම එක වගේමයි.

"අනේ, මගේ අසරණ මැටිල්ඩා! මගේ ඒ මාලෙ බොරු දියමන්ති මාලයක්! හොඳටම වැඩි වුණොත් ඒක වටිච්චි ෆ්‍රෑන්කු පන් සීයක්

මෙවැනි යෝග්‍ය උදාහරණ තුනක්වත් දක්වමින් පිළිතුර ඉදිරිපත් කර තිබිය යුතු ය.

**ප්‍රශ්න අංකය 06**

**6. බුදුරජාණන් වහන්සේ 'අඟුල්මල් දමනය' කළ අවස්ථාව කතුවරයා විස්තර කරනුයේ පාඨකයාගේ සිතෙහි වාක් චිත්‍රයක් මැවෙන ආකාරයෙනි. අමාවතුර නිර්දිෂ්ට කොටසින් උදාහරණ තුනක්වත් දක්වමින් විස්තර කරන්න.**
**(ලකුණු 10 යි)**

බුදුරජාණන් වහන්සේ 'අඟුල්මල් දමනය' කළ අවස්ථාව කතුවරයා පාඨකයාගේ සිතෙහි වාක්චිත්‍ර මැවෙන ආකාරයෙන් නිරූපණය කර ඇති ආකාරය

- බුදුරදුන් හා අංගුලිමාල සම්මුඛ වන අවස්ථාව සජීව වාක්චිත්‍ර මවමින් රූපණය කර ඇති ආකාරය විශිෂ්ට ය. එම අවස්ථාවේ දී අංගුලිමාලගේ හැසිරීම තාත්ත්වික ලෙස ඉදිරිපත් කර ඇත්තේය.

  "බුදුන් දැක විස්මිත වැ "මෙ මඟට පුරුෂයො දස දෙන දු විසි තිස් සතලිස් පනස් දෙන දු සැක ඇති වැ සන්නද්ධ වැ වග වග වැ එති. ඔහු මා අතැ නස්ති. එතෙකුදු හොත් මෙ මහණ එකලා වැ මා අභිභවමින් මෙන් එයි. මෙ මහණහු මැරුව මැනවැ'යි කඩු පලඟ ගෙනැ දුනු හියවුර බැඳැ බුදුන් පස් පස් ලුහුබඳවමින් යෙයි..."

- බුදුන් වහන්සේගේ පසුපස හඹා යෑමට ගොස් අංගුලිමාල වෙහෙසට පත්වන ආකාරය

  "බුදුහු පෙරට මහත් අභිගණයක් දක්වා තුමූහු මධ්‍ය වෙති. හෙ අන්ත්‍ය වෙයි. දැන් මොහු හඹා ගන්මි යි බැල පමණින් දිවෙයි..."



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

- බුදුරදුන් හා අඟුල්මල් සම්මුඛ වන අවස්ථාව

"බුදුනට "සිට මහණ" යි කීයැ. බුදුහු "මම සිටියෙමි. තොද සිට' යි" වදාළො. මෙවෙනි සිංහනාදයෙක් අනෙකක් හට වන්නෙ නො වෙයි. මෙ මහමායා දෙවිය පුත් සිද්ධත් මහරජහු ගෙ ගර්ජනා යැ. මම් තියුණු නුවණ ඇති සම්මා සම්බුදුන් විසින් දක්නා ලද බන්දෙමි."

"මෙතැන් පටන් - ගෙතැ පව් නොකෙරෙමි. තොපගෙ මියුරු කථා අසා යැ" යි තමා ගෙ අඟුල්මාලුට ප්‍රපාතයෙහි බහා පියා බුදුන් වැඳැ පැවිජ අයදි යැ. බුදුහු ඔහුට එහිභික්ෂුභාවයෙන් පැවිදි දුන්හ...

සංක්ෂිප්ත කතා රීතිය මනාව උපයුක්ත කොට ගනිමින් සජීව අවස්ථා හා සිද්ධි නිරූපණ මඟින් කතුවරයා වාක්චිත්‍ර මවා ඇති ආකාරය යෝග්‍ය උදාහරණ දක්වමින් විස්තර කොට තිබිය යුතු ය.

## ප්‍රශ්න අංකය 07

7. මිනිස් දිවිය අර්ථවත් කර ගැනීම උදෙසා ජන කවියෙන් මග පෙන්වා ඇති අයුරු 'නානා හිය පානා අඩහැරෙන් දැනේ' පාඨය ඇසුරෙන් උදාහරණ තුනක්වත් දක්වමින් පැහැදිලි කරන්න. (ලකුණු 10 යි)

මිනිස් දිවිය අර්ථවත් කර ගැනීම උදෙසා ජනකවියෙන් මග පෙන්වා ඇති අයුරු

- මිනිස් දිවියේ විවිධ අවධි අර්ථවත් ව ගත කිරීම විෂයයෙහි ජනකවියෙන් මග පෙන්වා ඇති අයුරු

ඇස නැති දා පොත ගත්තේ කියන්ටද
දත නැති දා උක් දඬු ගිනි තපින්ටද
වෙර නැති දා ගහගත්තේ දින්නටද
යුද ඇති දා නැති කග කොස් කොටන්ටද

එක් උන දාට උක් දණ්ඩේ පැණි සේමා
වෙන් උන දාට යක් දෙබරේ වද සේමා
ගොසින් ගොසින් කටු අත්තේ අග සේමා
ඉතින් ළදේ කරිවිල තිබ්බටු සේමා

තහින දෙහින කාලෙට පින් කෙරුම යුත
වහින කලට කුරින් විල්වලින් එත
බහින දියෙන් දෝතක් මුත් ගතොත් ඇත
පනින රිලවුංට ඉනිමං කමක් නැත

- දෛනික ජීවිතයේ විවිධ කාර්යයන්හි නියැළීමේ දී ඒවා සාර්ථක ව ඉටු කරගැනීම සඳහා උපදේශ සපයා ඇති ආකාරය

ගොඩැල්ලේ තරම දනගෙන ළිඳ කපනු
බොරැල්ලේ තරම දනගෙන උඩ පනිනු
කඩුල්ලේ තරම දනගෙන කද බදිනු
තමුන්ගේ තරම දනගෙන කල් හරිනු



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

ගසට කෙටූම ගස මුල පැයූමෙන් දූනේ
මිනිහා නොමිනිහා යන කඩිසරෙන් දූනේ
අමුතු බත් දීම අත ඇල්ලූමෙන් දූනේ
හානා හීය පානා අඬහැරෙන් දූනේ

- මිනිසාගේ යහගුණ සේ ම දුර්ගුණ ද සමසිතින් දරා ගනිමින් ජීවිතය සාර්ථක කර ගැනීම සඳහා සදුපදේශ සැපයීම

වරද පෙනෙන තරමට වැරදුණා නොවේ
වරද ඇතත් නිකරුණෙ වැඩ කළා නොවේ
වරද පෙනෙති වැඩ නුගත් අයට ලොවේ
වරද නැති කෙනෙක් නැත සකිය මේ ලොවේ

රන් විමනේ සිටි මුත් දුක නැති වෙද්ද
පැණි මීයේ කෑ මුත් බඩ ගිනි නැද්ද
මිණි බරණින් සැදු මුත් ගත නොදිරද්ද
පැණිවරකා ගසටත් හෙණ නොවදිද් ද

අඳුරු කරුවලේ පඳුරට මුවා වෙලා
විදුලි එළිය දැක ගිනිහුළ දියේ හෙලා
අනුන් ලියන් දැක තම ලියට තල තලා
දුවන මුවන් දැක නොදමන් නෙළුව පලා

මෙවැනි යෝග්‍ය උදාහරණ තුනක්වක් දක්වමින් පිළිතුරු සපයා තිබිය යුතු ය.

❖ 5, 6, 7 පිළිතුරු සඳහා උදාහරණ 3ට ලකුණු 03 යි.
සමස්ත විස්තරයට ලකුණු ලකුණු 07 යි.

මුළු ලකුණු 10 යි.

WWW.OLEVELAPI.COM

****

(1) 87 86 | (2) 87 87 | (3) 86 87



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....